NIBM
BUILDING COMPETENCIES

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report 2014



ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය
தேசிய வியாபார முகாமை நிறுவனம்
NATIONAL INSTITUTE OF BUSINESS MANAGEMENT

"THE MOST TRUSTED EDUCATION BRAND IN SRI LANKA"

NIBM
BUILDING COMPETENCIES



ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

ක්ෂණික ඇමතුම් = 011 5321000

වෙබ් : www.nibm.lk

පටුන **පිටු අංක**

අප ගැන 2

ආයතනික දැක්ම මෙහෙවර සහ අරමුණු 3

අපගේ සහතික කිරීම 4

අප ආ ගමන් මග 6

පාලක සභාව 7

ආයතනික හැඳින්වීම 9

මානව සම්පත් කළමනාකරණය 10

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය 16

අපගේ ක්‍රියාකාරකම්

ආයතනික සමාජ සත්කාරයන් 27

වසරේ ලගාකර ගැනීම් 28

අනාගත ගමන්මග 30

අංශවල ව්‍යුහය 31

- ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය 33
- කළමනාකරණ සංවර්ධන අංශය 34

ප්‍රාදේශිය මධ්‍යස්ථාන 37

පුස්තකාලය සහ ප්‍රලේඛන මධ්‍යස්ථානය 43

වාර්ෂික ගිණුම් පිළිබඳව විගණකාධිපති වාර්තාව 50

මුල්‍ය ප්‍රකාශණ (වාර්ෂික ගිණුම්)

විගණකාධිපතිගේ ගුණාදොස් දැක්වීමට පිළිතුරු

අපගේ දැක්ම

"ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ව්‍යාපාරික අධ්‍යාපන ආයතනය බවට පත්වීම."



අපගේ මෙහෙවර

"අපි පුහුණුව, අධ්‍යාපනය සහ උපදේශනය මගින් ජනතාවගේත්, සංවිධානවලත් නිපුණතා සංවර්ධනය කිරීමේ කාර්යයෙහි නිරතව සිටින්නෙමු."

අපගේ අරමුණු

- වෘත්තිය දැනුම හා සුදුසුකම් අපේක්ෂා කරන පුද්ගලයන්ට අදාළ විෂයයන් පිළිබඳ උසස් මට්ටමේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයක් හා උපදෙස් ලබාදීම.
- මනාව ව්‍යුහගත කළ පුහුණු වැඩසටහන් මගින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධානවල කළමනාකරුවන් හා අධීක්ෂණ නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය කිරීම.
- කළමනාකරණයට නිර්මාණාත්මක හා ඵලදායී අයුරින් සහභාගි වීම සඳහා සේවකයන්ට පුහුණුව හා අධ්‍යාපනය ලබාදීම.
- අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන් මගින් සංවිධානවල ඵලදායිතාවය වර්ධනය කිරීමට පහසුකම් සැලසීම.
- රාජ්‍ය, පොදු හා පෞද්ගලික අංශයේ සංවිධානවල කාර්යසාධන ප්‍රමිති ස්ථාපනය හා සංවිධානවල සංවර්ධනය සඳහා මානව සම්පත්වල දායකත්වය ප්‍රශස්ත මට්ටමට පත්කිරීමට කළමනාකරණ උපදේශනය හා වෙනත් උපදේශන සේවා ලබාදීම.



අපගේ සහතික කිරීම

භාණ්ඩ මෙන්ම සේවා සැපයීමේදී එහි ගුණත්වය, එම භාණ්ඩය හෝ සේවාවට වඩාත් හොඳ සහතික කිරීමක් එක් කරනු ලබයි. සමාජය තුළ තත්වයෙන් උසස් භාණ්ඩ හෝ සේවා පිළිබඳව ඇතිව ඇති අවශ්‍යතාව සීඝ්‍රයෙන් වැඩි වී ඇත. මෙම සංකල්පය සැළකිල්ලට ගෙන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය මගින් ප්‍රධානය කරනු ලබන අධ්‍යාපනය සහතික කිරීමක් වශයෙන් තත්වය පිළිබඳව වඩාත් මෑතකදී එක් වූ ජාත්‍යන්තරව පිළිගන්නා වූ තත්ත්ව සහතිකයක් වූ ISO 9001 : 2008 ප්‍රමිතිය ලබාගන්නා ලදී. 2007 වර්ෂයේදී කළමනාකරණ තොරතුරු අංශය, එමගින් ලබාදෙන අධ්‍යාපනය හා සේවාව වෙනුවෙන් ISO 9001 : 2008 තත්ත්ව සහතිකය තම අංශයට හිමි කර ගන්නා ලදී. වර්ෂ 2009 දී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ජාතික තත්ත්ව සහතික ප්‍රධාන උත්සවයේදී කුසලතා සම්මානය හිමි කර ගන්නා ලද අතර විශිෂ්ඨතම සේවාවක් සැපයීම තහවුරු කරමින් ISO 9001 : 2008 තත්ත්ව සහතිකය ආයතනයේ සමස්ත ක්‍රියාවලිය වෙනුවෙන් හිමිකර ගන්නා ලදී.

"The Place with
ASSUARANCE"


SGS

Certificate SG09/02538

The management system of

National Institute of Business Management

No:120/5,Wijerama Mawatha,
Colombo 07,
Sri Lanka.

has been assessed and certified as meeting the requirements of

ISO 9001:2008

For the following activities

Offering short term and long term Professional certification courses including Diploma and Higher Diploma

Further clarifications regarding the scope of this certificate and the applicability of ISO 9001:2008 requirements may be obtained by consulting the organisation

This certificate is valid from 1 September 2012 until 31 August 2015 and remains valid subject to satisfactory surveillance audits.
Re certification audit due before 31 July 2015
Issue 2. Certified since 1 September 2009

Authorised by

SYSTEM CERTIFICATION ISO 9001 SGS

UKAS MANAGEMENT SYSTEMS 005

SGS United Kingdom Ltd Systems & Services Certification
Rossmore Business Park Ellesmere Port Cheshire CH65 3EN UK
t +44 (0)151 350 6666 f +44 (0)151 350 6600 www.sgs.com

SGS 9001-8 01.0311

Page 1 of 1

This document is issued by the Company subject to its General Conditions of Certification Services accessible at www.sgs.com/terms_and_conditions.htm. Attention is drawn to the limitations of liability, indemnification and jurisdictional issues established therein. The authenticity of this document may be verified at http://www.sgs.com/en/certified_clients.htm. Any unauthorized alteration, forgery or falsification of the content or appearance of this document is unlawful and offenders may be prosecuted to the fullest extent of the law.

ආයතනයේ පරමාර්ථ

ආයතනයේ අපේක්ෂිත ව්‍යවස්ථාපිත පරමාර්ථ පහත පරිදි වේ.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්මික හා වාණිජ ආයතනවල කළමනාකරුවන් හා අධීක්ෂණ නිලධාරීන්ගේ සේවය දියුණු කිරීම.
- කළමනාකාරීත්වය සමඟ නිර්මාණාත්මක ලෙස සහභාගි වීමට සේවකයන් පුහුණු කිරීම සහ අධ්‍යාපනයක් ලබා දීම.
- කළමනාකරණ විශේෂඥ සේවාවන් ලබාදීම, කාර්යසාධන ප්‍රමිති ස්ථාපනය කිරීම හා ඵලදායිතාව ඉහළ නැංවීම.
- කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස මානව දායකත්වය ප්‍රශස්ත මට්ටමට නැංවීම සඳහා වෙනත් ක්‍රියාකාරකම් ඉටුකිරීම.
- පරිසරය වඩා හොඳින් අගය කිරීම සඳහා අදාළ සමාජ ආර්ථික සංසිද්ධීන් සහ කළමනාකරණ අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ දත්ත එකතු කිරීම.
- බාහිර සංවිධාන සඳහා කළමනාකරණ තොරතුරු සේවා ලබාදීම හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි සේවක පිරිස් පුහුණු කිරීම.
- සංස්ථාපිත අංශයට තම පද්ධති, පරිපාටි හා කාර්ය ක්‍රම දියුණු කිරීම, සැලසුම්කරණ කාර්යයන්ට සහාය වීම හා සාමාන්‍යයෙන් වෙනස් වන පාරිසරික සාධකයන් නිසා මුහුණපෑමට සිදුවන අභියෝගවලට මුහුණ දීම සඳහා උපදේශක සේවා සම්පාදනය.
- අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන් මගින් සංවිධානවල ඵලදායිතාව දියුණු කිරීමට පහසුකම් සැලසීම.

අපගේ සේවා සැපයීම පහතපරිදි වේ.,

- **අපගේ සේවාලාභීන් සඳහා,**

ඇ) පුද්ගලයන් රැකියාභිමුක, පිළිගැනීමට පාත්‍ර වන සුදුසුකම් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන අතරම ඔවුන්ගේ නිපුණතා වර්ධනය කිරීම.

ආ) සංවිධාන සංවිධානවල කාර්යසාධන ශක්‍යතා වර්ධනය සඳහා හැකියාවන් ශක්තිමත් කිරීම.

- **අපගේ කාර්ය මණ්ඩලය වෙත**

වෘත්තීය නිදහස, කාර්යසාධනය පදනම් කරගත් ප්‍රදාන, මිත්‍රශීලී වැඩ පරිසරය හා ආයතනය සමඟ ඉගෙනීමට හා වර්ධනයට අවස්ථා සැපයීම.

- **අපගේ බාහිර ආචාර්ය ගණයට,**

පිළිගැනීම සාමාන්‍ය මට්ටමට වැඩි ප්‍රදාන හා ජාලගත වීමට අවස්ථා ලබාදීම.

- **අපගේ හවුල්කරුවන් වෙත,**

ගෝලීය මට්ටමේ පහසුකම් හා විශේෂඥ දැනුම ලබාදීම.

- **අපගේ සමාජයට,**

දැනුම බෙදාහැරීම හා ඵලදායිතා වර්ධනය

අප ආ මඟ

1968

කළමනාකරණ සංවර්ධන හා ඵලදායිතා මධ්‍යස්ථානය (MDPC) පිහිටුවීම.

1968 - 1976

කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ කළමනාකරණ සංවර්ධන හා ඵලදායිතා මධ්‍යස්ථානය ස්වාධීන සංවිධානයක් ලෙස ස්ථාපිත කරන ලදී.

කළමනාකරණ සංවර්ධන හා ඵලදායිතා මධ්‍යස්ථානය ජාතික කළමනාකාරීත්ව ආයතනය (NIM) යන නාමය යටතේ ක්‍රියාත්මක වීම ආරම්භ කරන ලදී. පසුව මෙම අධ්‍යාපන ආයතනය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ලෙස සංස්ථාපිත කරන ලදී.

1980 -1986

පළමු පරිගණක පද්ධති නිර්මාණකරණය පිළිබඳ ඩිප්ලෝමාව ආරම්භ කිරීම සහ පළමු ප්‍රාදේශීය මධ්‍යස්ථානය කුරුණෑගල දී ස්ථාපිත කිරීම.

1991- 1996

රාජ්‍ය අංශයේ ස්වමූල්‍යන සංවිධානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය පිළිබඳ පාර්ලිමේන්තු පනත සංශෝධනය කිරීම.

“වෙනස් වන පරිසරයක් තුළ ඵලදායිතාව ඉහළ නැංවීම” යන තේමාව යටතේ වාර්ෂික සම්මේලනය පවත්වමින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය තම 25 වන සංවත්සරය සැමරීම.

තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව අයර්ලන්තයේ ඩබ්ලින් විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතාවයෙන් ආරම්භ කරන ලදී.

මධ්‍යම පළාත තුළ ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

1999 - 2004

අයර්ලන්ත ජාතික විශ්වවිද්‍යාලයේ තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ප්‍රදානය කිරීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ පළමු උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීම.

ව්‍යාපාර කළමනාකරණයට අදාළ සියලු කරුණු පිළිබඳ සභාවට උපදෙස් දීම සඳහා 1991 අංක 28 දරණ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනත යටතේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපන මණ්ඩලය ස්ථාපිත කිරීම.

ආයතනයේ තත්ත්වය හා ඵලදායිතාව ඉහළ නැංවීමට දායක වූ ජපන් S 5 සංකල්පය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය තුළ ක්‍රියාවට නැංවීම සිදුකිරීම.

2007 - 2014

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ව්‍යාපාර පරිපාලනය, මූල්‍ය, මානව සම්පත්, තොරතුරු පද්ධති කළමනාකරණය කාර්ය සම්පාදන හා කාර්මික කළමනාකරණ ආදී විද්‍යාවේදී උපාධි හැදෑරීමට සුදුසුකම් ලැබීම.

තොරතුරු පද්ධති කළමනාකරණ අංශය එමගින් ලබාදෙන උසස් තත්ත්වයේ අධ්‍යාපනය වෙනුවෙන් ISO 9001:2008 සහතිකය ලබා ගන්නා ලදී.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ 45 වන සංවත්සරයට සමගාමීව වඩාත් ඉඩකඩ සහිත ඉගෙනුම් කලාප ඇති කිරීම සඳහා පාලක සභාව විසින් ආයතනයේ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම වෙනුවෙන් ආයෝජනය කරන ලදි.

ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ උපාධි පිරිනැමීමේ පාසල වන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතය නුගේගොඩදී ආරම්භ කිරීම සහ එහි කාර්යයන් සාර්ථක අයුරින් පවත්වාගෙන යාම.

පාලක සභාව

මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා
සභාපති,
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය,
120/5, විජේරාම මාවත
කොළඹ 07.

ආචාර්ය ඊ.ඒ. වීරසිංහ මහතා
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය,
120/5, විජේරාම මාවත,
කොළඹ 07.

අජිත් වතුහේවා මහතා
සභාපති
ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය
467/1/1 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත
කොළඹ 14

සුනිල් විජේසිංහ මහතා
සභාපති,
ජාතික වාණිජ මණ්ඩලය,
450, ඩී ආර් විජේවර්ධන මාවත,
කොළඹ 10.

ආචාර්ය අජන්ත ධර්මසිරි මහතා
වැඩබලන අධ්‍යක්ෂ
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය,
28, ලෙස්ලි රණගල මාවත,
කොළඹ 08

නිලන්ති සුගතදාස මහත්මිය
අතිරේක ලේකම් (තරුණ සංවර්ධන)
තරුණ කටයුතු හා නිපුතා සංවර්ධන අමාත්‍යාංශය,
නිපුනතා පියස, 354/2, ඇල්විටිගල මාවත
කොළඹ 05

ජේ පී මාම්පිටිය මහත්මිය
සහකාර අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව,
30, ජනාධිපති මාවත
කොළඹ 01.

ඩී සී ඩබ් හපුගොඩ මහත්මිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ,
රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව,
මුදල් හ සැළසුම් අමාත්‍යාංශය
කොළඹ 01.

රෙෂාන් දේවපුර මහතා
ප්‍රධාන විධායක නිලධාරි,
ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනය,
160/24, කිරිමණ්ඩල මාවත
කොළඹ 05.

රම්මය චන්ද්‍ර ගුණසේකර මහතා
නිතිඥ,
33, සිරි ධර්මාරාම පාර
මාතර

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ව්‍යාපාරික අධ්‍යාපන ආයතනය වන්නේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයයි. අපි ගෝලීය ප්‍රවණතා සමඟ ඉදිරියට යමින් කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙස නිරතුරුව ම අපගේ නිපැයුම් උත්ශ්‍රේණිගත කරන්නෙමු. පසුගිය කාලය මුළුල්ලේ කළමනාකරණය, පුහුණු කටයුතු හා අධ්‍යාපනය සම්බන්ධ ප්‍රමුඛ ආයතනය බවට පත් වෙමින් අපගේ අනන්‍යතාවය ගොඩනගාගෙන ඇත්තෙමු. අප ආයතනය දහස් ගණනකට වඩා යහපත් අනාගතයක් ගොඩනගා ගැනීමට උපකාරී වී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහයෝගය ඇතිව අන්තර්ජාතික කම්කරු සංවිධානයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයක් ලෙස ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය, 1968 දී කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද අතර දැනට වසර 46 ක් පුරා මෙමගින් සේවාවන් සපයා ඇත. පසුව එය පාර්ලිමේන්තු පනතක් මගින් (1976 අංක 23 දරණ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනත) ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ලෙස සංස්ථාපිත කරන ලදී.

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය රාජ්‍ය අංශයේ අධ්‍යාපන ආයතනයක් ද වේ. අප ආයතනය ස්ව ශක්තියෙන් මෙහෙයවෙන, ජාත්‍යන්තරව පිළිගත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් උපාධි පිරිනමන ආයතනයකි. එමෙන්ම අප ආයතනය 2009 වසරේ සිට ජාතික තත්ත්ව සම්මාන ප්‍රදානයේ දී ගෞරව සම්මානයෙන් පිදුම් ලද අතර ISO 9001:2008 තත්ත්ව සහතිකය ද හිමිකර ගැනීමට හැකි විය.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ පාලක සභාව විසින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනතේ විධිවිධාන මත පදනම්ව ව්‍යාපාර කළමනාකරණ ජාතික පාසල නමින් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ වාණිජ ව්‍යවසායකත්වයක් ලියාපදිංචි කිරීමට තීරණය කර ඇත. මෙය ආරම්භ කරන ලද්දේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කරන ලද 'මාර්ගෝපදේශයක් රාජ්‍ය ව්‍යවසායකත්වයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය' මත පදනම්ව ය. මෙය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයට පූර්ණ හිමිකම සහිත උප ආයතනයක් ලෙස කටයුතු කරනු ඇත.

මානව සම්පත් කළමනාකරණය

ආයතනයේ අරමුණු ළඟා කර ගැනීමටත් ශිෂ්‍යයන්ට හා කාර්ය මණ්ඩලයට අගයන් ලබාදීමටත් ආයතනයේ කාර්ය මණ්ඩලය මනාව කළමනාකරණය කිරීම ඉතා වැදගත් බව ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හඳුනාගෙන ඇත. අපගේ සේවක පිරිස ආයතනික වගකීම් ඉටුකිරීමේලා පූර්ණ වශයෙන් නියැලී සිටින බව තහවුරු කිරීම සඳහා පහත සඳහන් සංඝටක අනුකලනය කෙරෙන ආකෘතියක් ගොඩනගා ඇත.

- බඳවා ගැනීම, තෝරා ගැනීම හා ස්ථාපනය
- උපාය මාර්ගික මෙහෙයුම (දීර්ඝකාලීන)
- කාර්ය සාධන ඉලක්ක (කෙටිකාලීන)
- කාර්යසාධන ඇගයීම
- පුහුණුව හා සංවර්ධනය
- ප්‍රතිලාභ කළමනාකරණය
- වෘත්තීය අභිවර්ධනය

මෙම සංඝටකයන් එකිනෙක අනුකලනය වී තම කාර්යය හා සංවිධානය කෙරෙහි ඉහළ මට්ටමේ සේවක කැපවීමක් ඇති කරන ආකාරය පහත දැක්වෙන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ මානව සම්පත් කළමනාකරණ ආකෘතිය මගින් පැහැදිලි කෙරේ.



ආකෘතිය මානව සම්පත් කළමනාකරණ ආකෘතිය

ආයතනයේ සේවකයින් කොටස් දෙකකට බෙදා දැක්විය හැක. එනම් දැනුම, නිපුණතා වර්ධනය හා උපදේශනය මගින් සෘජුවම අගයන් ඇති කිරීමේ ක්‍රියාවෙහි නියුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආයතනය මනාව පවත්වාගෙන යාමට අවශ්‍ය සේවය සපයන අනධ්‍යයන කාර්ය මණ්ඩලයයි. මෙම කාණ්ඩ සඳහා වන කාර්යසාධන ඇගයීම හා එහි ප්‍රතිලාභ ලබාදීමේ සැලැස්ම එකිනෙකට වෙනස් ය. කෙසේ වුව ද මෙම කාණ්ඩ දෙක සඳහා කාර්යසාධන ඇගයීම හා ප්‍රතිලාභ ලබාදීම ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයනයේ ඉලක්ක හා අරමුණු ළඟා කරගැනීම හා සම්බන්ධ වේ.

ඉහත ආකෘතියෙහි දැක්වෙන පරිදි අප සේවකයන්ට සංවිධානයේ අවශ්‍යතා මත පදනම් කරගත් රැකියා විශ්ලේෂණය තුළින් බිහි වූ රැකියා විස්තර හිමි වේ. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ දීර්ඝකාලීන හා මධ්‍යකාලීන සැලසුම්වල කොටසක් මත දැක්ම, මෙහෙවර හා අරමුණු මගින් සේවකයන් උපයාමාර්ගිකව මෙහෙයවනු ලැබේ. අරමුණුවලින් සැදුම්ලත් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් වාර්ෂික අයවැයෙහි ඉලක්ක ළඟා කරගැනීමත් එක් එක් සේවකයා සතු වගකීම වේ.

සේවකයන්ගේ වගකීම් හා සම්බන්ධ කාර්යසාධනය මැන බැලීම කාර්යසාධන ඇගයීම් පත්‍රයක් මගින් වාර්ෂිකව සිදු කරනු ලබයි. උපදේශකවරු හා අධ්‍යක්ෂකවරු සම්බන්ධ කාර්යසාධන ඇගයීම් පත්‍රවල අන්තර්ගතය හා විශ්ලේෂණයෙහි ගැඹුර සෙසු කාර්ය මණ්ඩලය හා සසඳන විට මඳ වශයෙන් වෙනස් වන්නේ වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබා ගැනීමත් අවබෝධයත් සඳහා ය. සේවකයකුගේ කාර්යසාධනය, රැකියා විස්තරය හා වාර්ෂික අයවැයෙහි දක්වෙන අපේක්ෂා සපුරාලන විට දිරිදීමනා, උසස්වීම්, වැටුප් වර්ධක හා කාර්යය ප්‍රසාරණය ආදිය මගින් ප්‍රතිලාභ ලබාදෙනු ලැබේ.

කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු වූ විට තම රැකියාව සඳහා අවශ්‍ය වන කුසලතා හා නිපුණතා වැඩිදියුණු කරගැනීම සඳහා සේවකයා හට පුහුණු හා සංවර්ධන අවස්ථා සලසා දෙනු ලැබේ. සේවකයාගේ ආකල්ප හා හැසිරීම නිවැරදි කිරීම සඳහා ද පුහුණුව හා සංවර්ධනය ඉවහල් වේ.

වැඩි වශයෙන් සුදුසුකම් හා නිපුණතා ලබා ගැනීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය විසින් මෙහෙයවනු ලබන වැඩසටහන් මෙන් ම බාහිර වැඩසටහන් සඳහා ද සහභාගි වීමට අපගේ සේවකයන් දිරිමත් කෙරේ. සේවකයකු ඉහළ සුදුසුකම් ලබා ගත් විට ඔහුට/ඇයට වඩා ඉහළ තනතුරක් සඳහා අයදුම් කිරීමට හැකියාව ලැබේ.

පහත දක්වෙන භෞතික ප්‍රතිලාභ හා නිවැරදිව ලබාදෙන සහයෝගය මගින් සේවක තෘප්තිය ඉහළ නැංවීමට අපි උත්සාහ දරන්නෙමු.

- මූල්‍ය ප්‍රතිලාභ: දිරිදීමනා, වැටුප් වර්ධක, වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන වියදම් ප්‍රතිපූර්ණය කිරීම.
- මූල්‍ය නොවන ප්‍රතිපාදන: උසස්වීම්, විදේශ පුහුණු වැඩසටහනන්
- වැඩ පරිසරය/පහසුකම් වැඩිදියුණු කිරීම.
- වෘත්තිය අභිවර්ධනය හා වර්ධනය සඳහා අවස්ථා.
- සේවා ප්‍රසාරණය හා සඵලකරණය.
- අධීක්ෂකයන්, සමාන මට්ටමේ පුද්ගලයන් හා යටත් නිලධාරීන්ගේ සහාය.

අපගේ සේවක තෘප්තිමත්භාවය මැනීම තුළින් සේවකයා අදාළ ක්ෂේත්‍රවල ලබා ඇති ප්‍රගතිය කවර මට්ටමක පවතී ද යන්න පෙන්නුම් කරයි. එම ප්‍රගතිය පහළ මට්ටමක පවතින ක්ෂේත්‍ර ඇතොත් ඒවා දියුණු කිරීම සඳහා පවතින අවස්ථා හඳුනාගත හැකි වේ.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සමස්ථ සේවක පිරිස, දීර්ඝකාලීන වශයෙන් ශිෂ්‍යයන්/සේවාදායකයන් හා සංවිධාන ලබන තෘප්තිය වැඩිදියුණු කිරීම හා කෙටිකාලීන වශයෙන් අයවැයෙහි දක්වෙන ආදායම ලබාගැනීම යන පොදු අරමුණු සඳහා සේවය කරති. ඉහළ මට්ටමේ මූල්‍ය සාධනයන් ළඟා කර ගැනීම තුළින් ඔවුනට වඩා හොඳ ප්‍රතිලාභ ලබාගත හැක. මෙය ඉටු කර ගත හැක්කේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ කම්කරුවන්ගේ සිට උපදේශකයන් දක්වා සියලුම සේවක ස්ථරයන්ගේ සාමූහික ප්‍රයත්නය හා සහයෝගීතාවය තුළින් ය. අපගේ සේවා පද්ධතිය අනුව සෑම සේවකයකුටම අනන්‍ය වූ කාර්යභාරයක් තිබෙන අතර එය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ඵලදායීතාවයට දායක වේ. ආයතනයේ විවිධ ස්ථරයන් අතර සන්නිවේදනය ලියවිලි, චක්‍රලේඛ, දැන්වීම්, රැස්වීම් වාචික උපදෙස් හා ප්‍රතිචාර, දුරකථන ඇමතුම් හා විද්‍යුත් තැපෑල මගින් ඉටුවේ. මහනුවර, ගාල්ල හා කුරුණෑගල මධ්‍යස්ථාන සමඟ සන්නිවේදනය ද එම ක්‍රමවේද සුදුසු අයුරින් යොදා ගනිමින් සිදු කෙරේ.

මානව සම්පත් සංවර්ධනය

මානව සම්පත් සංවර්ධනය යනු ඉදිරියට යාමට හැකිවන අයුරින් සේවක මණ්ඩලයේ වගකීම් බෙදාදීම සහ ඒ මොහොතේ දී ම ඉගෙනුම් හා සංවර්ධන අවස්ථා ලබාදීම සිදු කිරීමයි. සේවකයින්ගේ සම්පූර්ණ රැකියා භූමිකා හා වැඩ ක්‍රියාවලිය තුළ සේවක දායකත්වය වර්ධනය කිරීම සඳහා නව පුහුණු හා සංවර්ධන වැඩසටහන්වලට පෙලඹවීම සිදු කෙරේ. කාර්යය මණ්ඩලයේ වාත්තීය දක්ෂතාව වර්ධනය කිරීමට ආයතනය කටයුතු කරයි. ආයතනය විසින් සේවක නිපුණතා විශ්ලේෂණය හා සේවක විශ්වාසනීයභාවය ඉදිරියට ගෙනයෑම සඳහා පහත සඳහන් ශිල්පක්‍රම භාවිතා කිරීම තුළින් සේවක ඵලදායීතාවය හා රැකියා තෘප්තිය වැඩිකිරීම සිදුවේ.

- කාර්ය මාරුව
- සේවකයන් අලුතෙන් ස්ථාපනය කිරීම.
- කාර්යය ප්‍රසාරණය
- රැකියාවේ වර්ධනය

ප්‍රධාන සේවක සංගම් දෙකක් පිහිටුවාගෙන ඇති අතර ඒවා පිහිටුවාගෙන ඇත්තේ ආයතනයේ ප්‍රධාන කාර්යයන් හා ජීවගුණය පවත්වාගෙන යාමට අන්‍යෝන්‍ය වශයෙන් බලපාන බැවිනි. එම සංගම් දෙක පහත පරිදි වේ:

- ක්‍රීඩා හා සුභසාධක සංගමය
- අවමගංල්‍යාධාර සංගමය

මානව සම්පත් පුහුණු කිරීම

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් සඳහා යොමුකර තිබේ. එම වැඩසටහන් පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

අභ්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම

	නම	සහභාගි වූ පාඨමාලාව
1	එස් වී ගාමිණී	පරිගනක විද්‍යාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
2	ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ උපදේශකවරුන් සහ විධායක නිලධාරීන්	මානව සම්පත් වැඩමුලුව

විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීම

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ වෘත්තීමය සහ විධායක කාර්මණ්ඩලයේ නිපුනතාවයන් වර්ධනය කිරීම සඳහා ඔහුන් දිරිගැන්වීමක් ලෙස විදේශීය පුහුණු අවස්ථාවන් ලබාදීම ආයතනයේ අරමුණක් වේ. විදේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම් පහතින් දක්වා ඇත.

	නම	සහභාගි වූ පාඨමාලාව
1	ඩී එම් ඒ කුලසූරිය මහතා	"Internationalization of Management Development and South Asian Response"
2	ආචාර්ය ඊ ඒ වීරසිංහ මහතා	Meeting of Partnership Development, University of Plymouth UCD
3	ඩී එම් ඒ කුලසූරිය මහතා	Meeting of Partnership Development, University of Plymouth UCD
4	ජී ඩී බර්නාඩ් සිල්වා මහතා	International Programme on Higher Education Management
5	පවිත්‍රා වික්‍රමසූරිය මහත්මිය	International Programme on Higher Education Management
6	පී එස් සී සමන් මහතා	International Programme on Higher Education Management
7	ජේ ඒ තුෂාරි මෙනවිය	International Programme on Higher Education Management
8	ධම්මිකා දන්ගල්ල මහත්මිය	International Programme on Higher Education Management
9	ආචාර්ය ඊ ඒ වීරසිංහ මහතා	1st GLOBAL JAC Networking Conference
10	ඩී එම් ඒ කුලසූරිය මහතා	1st GLOBAL JAC Networking Conference
11	ආර් ඒ කේ රණවක මහතා	Asia Pacific Annual Conference of AACSB
12	එච් එච් එල් අමරසිංහ මහතා	Asia Pacific Annual Conference of AACSB

දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීම

	NAME	COURSE TITLE
1	ඉමාන් ඇස්ලි මහතා	ISO 9001 ජාත්‍යන්තර විගණන පුහුණුව
2	මෙහොමඩ් රිහාම් මහතා	ISO 9001 ජාත්‍යන්තර විගණන පුහුණුව
3	හිරුණි රත්වත්ත මෙනවිය	ISO 9001 ජාත්‍යන්තර විගණන පුහුණුව
4	සේනානි වාසනා තේනුවර මිය	ISO 9001 ජාත්‍යන්තර විගණන පුහුණුව
5	තිසර සාරංග මහතා	ISO 9001 ජාත්‍යන්තර විගණන පුහුණුව
6	ආර් එම් ජයතිලක මහතා	ISO 9001 ජාත්‍යන්තර විගණන පුහුණුව
7	ආර් එල් ද සොයිසා මහත්මිය	Training Course on Advanced Multimedia and Web Design and Development Techniques
8	එම් පී ටී සමරසේතර මහතා	වතුර මෝටර් සහ Compressor නඩත්තු කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව
9	ජී ඩී බර්නාඩ් සිල්වා මහතා	Programme on Building a Modern day Organization
10	එස් යෝගරාජ් මහත්මිය	Programme on Building a Modern day Organization
11	සමන් රොද්‍රිගෝ මහතා	Programme on Building a Modern day Organization
12	ජී ඒ ලක්ෂ්මන් මහතා	Programme on Building a Modern day Organization
13	නිල්මිණි ධර්මවර්ධන මහත්මිය	Programme on Building a Modern day Organization
14	සී මහන්තගේ මහත්මිය	Programme on Building a Modern day Organization
15	සීතා විජේසිංහ මහත්මිය	Programme on Building a Modern day Organization
16	ආර් ජී මංචනායක මහතා	ජාතික තොරතුරු තාක්ෂණ වැඩමුලුව 2014
17	නදීප් තරංග මහතා	Master Trainers for Purpose BPO Centre in NYC
18	සචිනි දිනුෂිකා මහන්තගේ මෙනවිය	Master Trainers for Purpose BPO Centre in NYC
19	ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ උපදේශක සහ විධායක නිලධාරීන්	ජාතික කළමනාකාරණ වැඩමුලුව 2014
20	කේ ජී අයි දිල්රුක්ෂි	ISO 9001 Quality Management Systems Lead Auditor Programme
21	ආර් එම් එස් හේරත් මහතා	Advanced Training Course on AutoCAD 2D & 3D
22	එස් අමිලාන් මහත්මිය	පිරිවැය ගණකාධිකරණය පිළිබඳ පුහුණු වැඩමුලුව
23	කේ කලප්‍රියා මෙනවිය	Project Management Certification
24	සී ඩී මුතුගමගේ මෙනවිය	ISO 9001 අභ්‍යන්තර විගණන පුහුණුව
25	සීතා විජේසිංහ මහත්මිය	ISO 9001 අභ්‍යන්තර විගණන පුහුණුව

වැඩ සටහන් සඳහා සහභාගි වූ සේවක සංඛ්‍යාව

	2013	2014
අභ්‍යන්තර පුහුණු වැඩසටහන්	16	02
දේශීය පුහුණු වැඩසටහන්	16	25
විදේශීය පුහුණු වැඩසටහන්	0	12
එකතුව	**32**	**39**

වගුව 01 පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ සේවක සංඛ්‍යාව



රූප සටහන 01 පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ පුහුණුවන්නන් ගණන

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ මානව සම්පත්

	අනුමත සේවක සංඛ්‍යාව **2014.12.31**	2010	2011	2012	2013	2014
අධ්‍යයන කාර්ය මණ්ඩලය	50	31	48	36	43	48
විධායක කාර්ය මණ්ඩලය	53	25	19	18	19	18
සහකාර කාර්ය මණ්ඩලය	119	100	93	97	92	97
එකතුව	**222**	**151**	**153**	**151**	**154**	**163**

වගුව 02 ආයතනයේ මානව සම්පත් සංයුතිය



රූප සටහන 02 ආයතනයේ මානව සම්පත් සංයුතිය

2014 වර්ෂයේදී ආයතනය සඳහා සේවක බඳවාගැනීම්

	නම	තනතුර	බඳවා ගැනීමේ දිනය
1	එරන්දි කිතුල්ගොඩ මහත්මිය	උපදේශක/ කථිකාචාර්ය	02.01.2014
2	එස් ඩී මහන්තගේ මෙනවිය	උපදේශක/ කථිකාචාර්ය	02.04.2014
3	ඒ එම් ඩී චන්ද්‍රසේන මෙනවිය	උපදේශක/ කථිකාචාර්ය	02.04.2014
4	ඩබ් එම් එල් එන් වන්නිනායක මහතා	උපදේශක/ කථිකාචාර්ය	02.04.2014
5	සී ඩී මුතුගමගේ මෙනවිය	උපදේශක/ කථිකාචාර්ය	21.04.2014
6	කේ එච් ජේ ඉමල්කා මෙනවිය	උපදේශක/ කථිකාචාර්ය	03.11.2014
7	ඩබ් එම් එස් ලක්ෂිකා මෙනවිය	උපදේශක/ කථිකාචාර්ය	03.11.2014
8	වී කේ එම් චන්දිමා මෙනවිය	උපදේශක/ කථිකාචාර්ය	03.11.2014
9	ඊ එම් ඒ එස් එදිරිසිංහ මෙනවිය	කළමනාකරණ සහකාර	10.07.2014
10	කේ ආර් රිනුෂා රාජපක්ෂ මෙනවිය	කළමනාකරණ සහකාර	01.08.2014
11	කේ සමීර සම්පත්	කම්කරු	01.08.2014
12	එන් එම් වීරමන්	කළමනාකරණ සහකාර	15.08.2014
13	එස් එල් වයෝමි අමිලා වාසනා	කළමනාකරණ සහකාර	03.11.2014
14	ඩී එම් රංජිත් දිසානායක	කම්කරු	01.12.2014
15	එස් චරුනි හෙට්ටිආරච්චි	කළමනාකරණ සහකාර	01.12.2014
16	පී එම් ප්‍රදීප් සංජීව	කම්කරු	01.01.2014
17	එල් ඩී බොතේජු	කම්කරු	01.01.2014
18	ඩී ආර් එරංග ගුණරත්න	කළමනාකරණ සහකාර	12.01.2014

2014 වර්ෂයේදී සේවයෙන් විශ්‍රාම ගැනීම

	නම	තනතුර	සේවයෙන් විශ්‍රාමගත් දිනය
1	ජී කරුණාරත්න මහතා	රියදුරු	18.12.2014

මෙහෙයුම් ආදායම හා ලාභය කෙරෙහි සේවකයින්ගේ දායකත්වය

රු.'000

	2010	2011	2012	2013	2014
මෙහෙයුම් ආදායම	551,155	814,687	982,166	1,247,573	1,468,094
ශුද්ධ ලාභය	111,752	298,453	365,042	449,710	410,101
කාර්ය මණ්ඩලය	151	153	177	204	222
මෙහෙයුම් ආදායම ඒක පුද්ගල	3,650	5,324	5,548	6,115	6,613
ශුද්ධ ලාභය ඒකපුද්ගල	740	1,950	2,062	2,204	1,847

වගුව 03 මෙහෙයුම් ආදායම කෙරෙහි සේවකයන්ගේ දායකත්වය



රූප සටහන 03 මෙහෙයුම් ආදායම කෙරෙහි සේවකයන්ගේ දායකත්වය

තරගකාරී වෙළෙඳපොළට මුහුණදීම සඳහා යොදාගන්නා ලද ක්‍රමවේදයන්

වත්මන් දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා සුදුසු හැකියාවන් හා නිපුණතාවයන්ගෙන් සපිරි වෘත්තිකයන්, උපාධිධාරීන් හා ඩිප්ලෝමා ලාභීන්ට තම සුදුසුකම් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයෙන් ලබාගැනීම සඳහා නූතන අවශ්‍යතා අනුව ක්‍රමානුකූලව හා සංවිධානාත්මක ආකාරයෙන් පාඨමාලා පවත්වනු ලැබේ. මෙම අරමුණු සපුරාගැනීම සඳහා 2014 වසරේ දී යොදාගන්නා ලද ක්‍රමවේදයන් පහත පරිදි ය.

සියලුම සේවාවන් සඳහා ආයතනය සෙනසුරාදා ඉරිදා හා රජයේ නිවාඩු දිනවල (පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා) විවෘතව පවතී.

ආයතනයේ වෙබ් අඩවිය තුළින් ඉදිරි අපේක්ෂකයන්ට අදාළ තොරතුරු ලබාගැනීම හා ලියාපදිංචි වීම කළ හැකි ය. වෙබ් අඩවිය www.nibm.lk.

පාඨමාලා ගාස්තු චෙක්පත්, ණයවරපත් හා මුදලින් ගෙවීම සඳහා පහසුකම් සපයා ඇත.

අධ්‍යයන වර්ෂය ආරම්භ වීමට පෙර පාඨමාලා සකස් කර ඇති බැවින් කලින්ම තම කාර්ය මණ්ඩලයට ගැළපෙන පුහුණු පාඨමාලාව තෝරාගැනීමට පුද්ගලික හා රාජ්‍ය අංශයන්ට හැකියාව ඇත.

වැඩ මුළුවේ කාලය දින හතකට වඩා අඩු නම් වැඩමුළුව සම්පූර්ණ කරන දිනයේ දී ම සහතික පත් නිකුත් කරනු ලැබේ.

අනෙකුත් පාඨමාලාවලට අදාළ සහතික පත් පාඨමාලා සම්පූර්ණ කරන දිනයේ සිට මසක් ඇතුළත නිකුත් කරනු ලැබේ.

ප්‍රදර්ශන, වැඩමුළු, මාධ්‍ය නිවේදන හා රූපවාහිනී දැන්වීම් වැනි ආකර්ශණීය ක්‍රමවලින් ආයතනයේ සේවාවන් පිළිබඳව ජනතාව දැනුවත් කෙරේ.

කොළඹ දී පමණක් පැවැත්වූ පාඨමාලා දැන් නුවර, කුරුණෑගල හා ගාල්ල යන ප්‍රදේශවල ද පැවැත් වේ.

උපදේශන, ඵලදායිතාවය හා කළමනාකරණ සංවර්ධන සේවාවන් රාජ්‍ය හා පුද්ගලික අංශයන්ගේ අවශ්‍යතාවන් අනුව සකසා ගත හැකි ය.

ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය වාර්ෂිකව උත්සවාකාරයෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වේ.

වෛද්‍ය රක්ෂණය

කාර්යය මණ්ඩලයේ සුබසාධනය හා යහපත් සෞඛ්‍යය වෙනුවෙන් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය මගින් යුනියන් ඇෂුවරන්ස් සමාගම සමග සම්බන්ධ වී නැවත අලුත් කළහැකි වෛද්‍ය රක්ෂණාවරණයක් ලබාගෙන ඇත. මෙම රක්ෂණාවරණය යටතේ ආයතනයේ සේවකයන්ගේ රෝහල්ගතවීමේ බිල්පත්වලට අමතරව සාමාන්‍ය වෛද්‍ය බිල්පත් හා රෝහල් බිල්පත්වලට අදාළ මුදල් ප්‍රතිපූරණය කරනු ලැබේ. එසේම අසාද්‍ය රෝග සඳහා රුපියල් ලක්ෂ 10 ක ජීවිත රක්ෂ ආවරණයක් වසරකට උපරිම සේවයින් 10 ක් සඳහා ඇතුලත්ය, මෙය සේවකයන් වෙනුවෙන් ආයතනය මගින් සිදුකරනු ලබන ඉතා වැදගත් සේවාවකි.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ උපාධි පාසල

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ජාතික විද්‍යායතනය NSBM

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතන හරිත විශ්වවිද්‍යාල නගරය සංවර්ධනයත් සමග එම ආයතනයේ උපායමාර්ගික අධ්‍යාපනය තුළින් සමෘද්ධිමත් සමාජයක් ගොඩ කිරීමට දායක වෙමින් අනාගත නායකකයන් නිර්මාණය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය සැළසුම් සකස් කර ඇත.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය 2007 අංක 07 දරන සමාගම් පනත මගින් කැබිනට් මණ්ඩල අනුමැතිය යටතේ 2011 ඔක්තෝම්බර් මස 07 වන දින ආරම්භ කරන ලදී. එය ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ උපාධි පිරිනමන ආයතනයයි. ව්‍යාපාරික පරිගනක හා ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම සඳහා ලොව කීර්තිමත් හා පිළිගත් විශ්ව විද්‍යාල සමග ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය ආසියාවේ සහ යුරෝපා කලාපය සමග සම්බන්ධතා ගොඩනගාගෙන ඇත.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතයේ දැක්මට අනුව අර්ථ දක්වා ඇති පරිදි එය අනාගත නායකයන් නිර්මානය කිරීමේ ප්‍රමමුතම ව්‍යාපාරික පාසල ලෙස ස්ථාපිත කර ඇත. අධ්‍යාපනය, අධ්‍යයන හා පර්යේෂණ තුළින් සමෘද්ධිමත් සමාජයක් ගොඩනැගිමට සැළකිය යුතු දායකත්වයක් සනිටුහන් කරමින් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය පහත අගයන් මෙහෙයවයි.

- ජීවිත පරිවර්තනයක නිරත
- අධ්‍යාපනික විශිෂ්ඨත්වයන් ලගාකරමින්
- පර්යේෂණ දිසානතියකට යොමුව
- ලොවපුරා ජාලකරණය තුළින්
- විශ්වාසවන්ත බවින් හා වගවීමෙන්
- නව්‍ය හා වෙනස්වීම් පෝෂණයෙන්

රුපියල් බිලියන 8.6 ක ණය මුදලක් ලංකා බැංකුවෙන් අනුමත කර ගැනිමෙන් පසු 2013 දෙසම්බර් මස 18 වන දින මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතන හරිත සරසවි ගනරය ආම්භ කිරීමේ ආසියාවේ දැනුමේ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමේ අරමුණ ඇතිව ආරම්භ කරන ලදී. දකුණු ආසියාවේ ප්‍රථම සහ එකම හරිත සරසවිය වශයෙන් අක්කර 26 ක භූමිභාගයක පිටිපන හෝමාගම මෙය ස්ථාපිත කර ඇත. සියලු පහසුකම් සහිත මෙම විශ්ව විද්‍යාලය ශිෂ්‍යයින්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩල භෞතික හා මානසික සුව පහසුව ඇති කිරීමේ අරමුණින් ස්ථාපිත කර ඇත. ජාතික ව්‍යපාර කළමනාකාරිත්ව විද්‍යායතනය නව්‍ය ආකෘතිය 2016 වසරේදී ආරම්භ කිරීමට නියමිතය. ශිෂ්‍යයින්ට අභිමානවත්ව අධ්‍යාපනය හැදෑරිය හැකි ආකාරයෙන් නවීන පහසුකම් හා උපාංගවලින් සමන්විත ස්වභාවික හා භෞතික පරිසර හිතකාමී නිර්මානයක් වශයෙන් සැකිල්ල සකස් වී ඇත. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයේ පිටිපන ඉදිකිරීම් කටයුතු සාර්ථකව සිදුවන අතර 2013 සැප්තැම්බර් 20 වන දින නුගේගොඩ අනුලා විද්‍යාලය අසල පරිගණක පාසල ආරම්භ කර එහි කටයුතු පුලුල් කර සාර්ථකව ක්‍රියාමක වේ. මෙම ගොඩනැගිල්ල සියලු නවීන පහසුකම් හා පරිගණක, මල්ටිමීඩියා හා අභ්‍යන්තර අලංකාරය සහිතව සිසුන් සඳහා අවශ්‍ය උපකරණ ශ්‍රවණාගාර පරිගණක විද්‍යාගාර හා පහළ මාලයේ ආපනශාලාවකින් සමන්විතව නිර්මාණය කර ඇත.

තවද මෙම වසරේදී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයේ පළමු වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගි වූ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යයන පාලක සභාව පාලක සභාවට එහි සත්කාරයන් සියසින් දැකගත හැකිවිය. මීට අමතරව ජාතික ව්‍යාපාර කළමනාකාරත්ව විද්‍යායතනය ලංකාවේදී පිරිනමන උපාධි සහතිකය සඳහා වැඩි අගයක් එක් කිරීමට AASB සමාජිකත්වය ලබාගත හැකිවිය.

මෙම වසරේදී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය වඩාත් සුවිශේෂ වූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපාධි පිරිනැමීම අනුමත වූ අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ (විශේෂ) උපාධිය විද්‍යාවේදී කළමනාකරණ තොරතුරු පද්ධති (විශේෂ) උපාධිය අනුමත විය.

2014 ජනවාරි 29 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ කළමනාකරණ හා පරිගණක විද්‍යාව සඳහා පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කරන ලදී.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය පාසල් 3 ක් වශයෙන් ආරම්භ කර ඇත. එනම් පරිගනක ව්‍යාපාර හා ඉංජිනේරු වශයෙනි එම තුන් වැදෑරුම් විෂයය ධාරාවන් යටතේ විදේශිය විශ්ව විද්‍යාල වන මැලේසියානු, අයර්ලන්ත, ලින්කොක්වින් සහ ප්ලිමන්ත් විශ්ව විද්‍යාල සමග සහයෝගයෙන් ස්ථාපිත කර ඇත.

ව්‍යාපාරික පාසලේ ව්‍යාපාර කළමනාකරණය, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය නීතීය ගණකාධිකරණය හා තවත් කළමනාකරණ ක්ෂේත්‍රයේ උපාධි රාශියක් ඉදිරිපත් කරයි.

පරිගණක පාසල මගින් උපාධි පාඨමාලා, පශ්චාත් උපාධි පාඨමාලා සහ පරිගණක ක්ෂේත්‍රයේ විශේෂිත වූ පාඨමාලා ඉදිරිපත් කරයි.

ඉංජිනේරු පාසල මගින් පරිගනක ඉංජිනේරු හා ඉලේකටෝනික උපකරණ පිළිබඳ උපාධි පාඨමාලා මෙන්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු හරහා ඉදිරියට යමින් කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ ජාත්‍යන්තරය සමග ජාල ගත වීම සිදුකරයි.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය ආරම්භ කර මාස කිහිපයක් වුවද 1968 දී ආරම්භ කරන ලද ජාතික ව්‍යාපාර කළමනාකකාරීත්ව ආයතනය ඉතිහාසයේ දශක කිහිපයක් ආපස්සට යයි. යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංය යටතේ ක්‍රියාත්මක වන මෙ ආයතනය දශක 4 ක කාලයක් පුරාවට ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ඵලදායිතාවය නැංවීමට අධ්‍යාපනය උපදේශණය හා පුහුනු කිරීමේ කාර්යයේදී ජාතියට විශාල සේවාවක් ඉටු කර ඇත.

දැක්ම

අනාගත නායකයන් නිර්මාණය කිරීමේ ප්‍රමුඛතම ව්‍යාපාරික පාසල බවට පත්වීම.

මෙහෙවර

අධ්‍යාපනය, ඉගෙනුම් සහ පර්යේෂනය තුළින් සමෘද්ධිමත් සමාජයක් බිහි කිරීමට දායක වීම.

අරමුණු

- දේශීය හා ජාත්‍යන්තර උපාධි ඉල්ලුම සපුරාලීම
- නව සොයා ගැනීම් තුලින් ජාතික හා ජාත්‍යන්තරය අත්කර ගැනීම
- ගෝලීය දැනුම් මධ්‍යස්ථාන සහ කර්මාන්ත සමග සම්බන්දවීම
- ජාතියේ බුද්ධිමය සංස්කෘතික හා සමාජ අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.
- දිගින් දිගටම ආයතනික සහභාගීත්වය වර්ධනය කිරීම.

“ හරිත සරසවි නගරය”

First of its kind in Sri Lanka







විශේෂ සිදුවීම් - 2014

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය 2014

2014 වර්ෂයේ ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය සැප්තැම්බර් මස 09 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාවේදී පැවැත්විණි.





HR වැඩමුලුව 2014

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ප්‍රථම මානව සම්පත් වැඩමලුව 2014 මාර්තු මස 07 වන දින ආයතන පරිශ්‍රයේදී පැවැත්විය. මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ විශේෂඥයින් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු මෙම වැඩසටහන මානව සම්පත් ක්ෂේත්‍රයේ අභියෝගයන්ට මුහුණදීම උදෙසා ශ්‍රී ලංකාව සකස් විය යුතු ආකාරය සම්බන්දයෙන් විශේෂ අවධානය යොමු කරන ලදී.





The Best Orator 2014





ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ඉංග්‍රීසි ඒකකය විසින් ප්‍රථම වරට සංවිධානය කරනු ලැබූ **"The Best Orator"** 2014 ජුනි මස 25 වන දින ආයතනයේ ශ්‍රවනාගාරයේදී පැවැත්විය. මෙම වැඩසටහන තුලින් සිසුන්ගේ ඉදිරිපත් කිරීමේ සහ කථිකත්ව හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණ විය.

NIBM Voice - 2014

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ අධ්‍යාපනය ලබන සිසුන්ගේ සංගීතමය නිපුනතාවයන් එලිදැක්වීමේ අරමුණින් ක්‍රීඩා සහ සුභ සාධක සංගමය මගින් සංවිධානය කරන ලද NIBM Voice – 2014 සංගීත ප්‍රසංගමය 2014 අප්‍රේල් මස 05 වන දින පැවැත්විය. භාතිය සහ සංතුෂ්ගේ සහභාගීත්වයෙන් පැවැති මෙම ප්‍රසංගය සිසුන්ට සහ දෙමාපියන්ට අමතක නොවන අත්දැකීමක් විය.





ඩිප්ලෝමා වැඩසටහන් සමාරම්භක උළෙල - 2014

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 2014 මාර්තු 06 වන දින ඩිප්ලෝමා පාඨමාලාවන්ගේ සමාරම්භක උළෙල පැවැත්විය. එහි මුඛ්‍ය දේශනය පවත්වන ලද්දේ වටවල වැවිලි සමාගමේ සහ යුනයිටඩ් මෝටර්ස් සමාගමේ සභාපති සුනිල් ජී විජේසිංහ මහතා විසිනි.





වෙසක් ධර්ම දේශණා වැඩසටහන සර්වරාත්‍රික පිරිත් දේශනය

2014 වර්ෂයේ ආයතනයේ සේවක මහත්ම/ මහත්මීන්ගේ සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් වෙසක් පෝය මුල්කරගෙන සිදුකරන ධර්ම දේශණා වැඩසටහන පැවැත්වීම සහ සර්වරාත්‍රික පිරිත් දේශනයක් පැවැත්වීම.





වාර්ෂික විනෝද චාරිකාව සහ සුහද හමුව සිංගප්පුරුව 2014

ක්‍රීඩා සහ සුභ සාධක සංගමය මගින් සංවිධානය කරන ලද වාර්ෂික විනෝද චාරිකාව සහ සුහද හමුව 2014 අප්‍රේල් මස 17, 18, 19 යන දිනවලදී සිංගප්පුරුවේදී සංවිධානය කරන ලදී. ඒ සඳහා සියලුම සාමාජික සාමාජිකාවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සම්බන්ධ කර ගන්නා ලදී.

ආයතනික සමාජ සත්කාර

ආයතනික සමාජ සත්කාරයන් අපගේ සංවිධානයේ වැදගත් සලකුණක් සේ අපි දකිමු. ඒ, අප ස්වභාවික සම්පත් වන ජලය, භූමිය යනාදිය භාවිතා කරන බැවින් මෙන්ම අපද්‍රව්‍යයන් ද මුදාහරින බැවිනි. අප, අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව හා කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන්හි උපදේශනයන්හි නිරත වන බැවින් අපගේ ශිෂ්‍යයන් හා ක්‍රියාකාරකම්වලට සහභාගි වන්නන්ගේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කරන්නෙමු. අවම සෘණාත්මක බලපෑම් ඇති කරනු වස් පිරිසිදු හා ආරක්ෂාකාරී වටපිටාවක් පවත්වාගෙන යන්නෙමු. අපගේ මානව සම්පත් ප්‍රතිපත්තීන් තුළින් සේවකයන්ගේ සුබසාධනය හා පෞද්ගලික ප්‍රතිලාභ වෙත අවධානය යොමු කර ඇත. එම නිසා ගුණාත්මක වැඩ රටාවක් තුළින් ගුණාත්මක ජීවිතයක් වෙත යොමුවීමට අපට හැකි වී ඇත.

ආර්ථිකමය වශයෙන් අපහසුතා ඇති එහෙත් දක්ෂ සිසුන් සඳහා වෘත්තීය උපදේශන සේවා, නොමිලේ සම්මන්ත්‍රණ හා ශිෂ්‍යත්ව ලබාදීම. අප විසින් සිදු කෙරේ. නැඟී එන තරුණ නායකයා සම්මානය හා ගැමි පාසල් වෙත පුස්තකාල පොත් ලබාදීම යනාදිය අපගේ ආයතනික සමාජ සත්කාරයන්හි විශේෂ අංගයන් වේ.

2014 වසර තුළ දී ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය මගින් පහත සඳහන් ආධාර ලබා දී ඇත.

- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ පර්යේෂන සහ සංවර්ධන කාර්යයන් සිදුකරන සිසුවකු සඳහා ලැප්ටොප් පරිගණකයක් ලබාදීම.
- වයඹ පළාතේ ගිරිඋල්ල කළාපයේ එලිබිච්චිය විදුහල සඳහා සංගීත භාණ්ඩ සහ පාසැල් උපකරණ පරිත්‍යාග කිරීම.
- ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සේවය කරන පී ඒ සමරසිංහ මහතාට හදවත් සැත්කම් සඳහා මුදල් පරිත්‍යාග කිරීම.
- මහනුවර දිස්ත්‍රික්කයේ මහපතාන කණිටු විදුහල සඳහා අභ්‍යාස පොත් සහ පාසල් උපකරණ පරිත්‍යාග කිරීම.
- මහනුවර දිස්ත්‍රික්කයේ වැඩිහිටි නිවාස වල මව්පියන්ට ඇඳුම් සහ ආහාර පරිත්‍යාග කිරීම.
- 2014 වර්ෂයේදී ආයතනයේ ප්‍රධාන කාර්යාලය කුරුණෑගල මහනුවර ගාල්ල මධ්‍යස්ථාන වලදී ලේ පරිත්‍යාග කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

ISO 9001 : 2008 සහතිකය

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව 2008 වසරේ දී ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2009 වසරේ දී ආයතනය වෙත ISO 9001: 2008 සහතිකය පිරිනමන ලදි. ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගනු වස් සැලසුම් කර ඇති වැඩසටහන් කාර්යක්ෂමතාවයෙන් හා නිරවද්‍යතාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ කැපවීම එමගින් විද්‍යාමාන වේ.


SGS

Certificate SG09/02538

The management system of

National Institute of Business Management

No:120/5,Wijerama Mawatha, Colombo 07, Sri Lanka.

has been assessed and certified as meeting the requirements of

ISO 9001:2008

For the following activities

Offering short term and long term Professional certification courses including Diploma and Higher Diploma

Further clarifications regarding the scope of this certificate and the applicability of ISO 9001:2008 requirements may be obtained by consulting the organisation.

This certificate is valid from 1 September 2012 until 31 August 2015 and remains valid subject to satisfactory surveillance audits.
Re certification audit due before 31 July 2015
Issue 2. Certified since 1 September 2009

Authorised by

SGS United Kingdom Ltd Systems & Services Certification
Rossmore Business Park Ellesmere Port Cheshire CH65 3EN UK
t +44 (0)151 350-6666 f +44 (0)151 350-6600 www.sgs.com

SGS 9001-8 01.0311

Page 1 of 1

UKAS MANAGEMENT SYSTEMS 005

SGS

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය වෙනුවෙන් ඵලදායිතා සම්මානයක්



ඵලදායිතා ප්‍රමිතීන් ළඟා කර ගැනීම උදෙසා ක්‍රමානුකූල හා කාර්යක්ෂම ලෙස තම අරමුණු සාක්ෂාත් කරගැනීම අගයනු වස් 2010 වසරේ දී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයට ජාතික ඵලදායිතා සම්මාන උළෙලේ දී කුසලතා සහතිකයක් පිරිනමනු ලැබිණි.

විශිෂ්ඨතම ව්‍යාපාර සඳහා වූ ජාතික සම්මානය 2014



2014 වර්ෂයේදී ජාතික වාණිජ මණ්ඩලය සංවිධානය කළ ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන උළෙලේ දී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය රාජ්‍ය අංශයේ ව්‍යාපාරයන් සඳහා පිරිනමන කුසලතා සම්මානය හිමිකර ගැනීමට සමත්විය.

මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය ආරම්භ කිරීම

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය 2014 දී විවෘත කරන ලද අතර එහි පරිගනක විද්‍යාගාර, පුස්තකාල, අධ්‍යයන ප්‍රදේශ සහ නවීන පහසුකම් සහිත දේශණශාලා පහසුකම්වලින් සමන්විත වේ. ආයතනය තුළ මෙම පහසුකම් ස්ථාපිත කිරීමෙන් කළමනාකරණය, අලෙවිකරණය, මානව සම්පත් කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය ක්ෂේත්‍රයන්ගේ පුලුල් උපදේශාත්මක සේවාවන් සැපයීමට පහසුකම් සැලසීමයි. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ මාතර මධ්‍යස්ථානයෙන් සාමන්‍ය පෙළ/ උසස් පෙළ සමත් සහ වෘත්තීන්හි නියතු අය සඳහා පාඨමාලාවන් හැදෑරීමට පහසුකම් සසා ඇත.

අනාගත ගමන්මඟ

අප මුහුණ දී ඇති අතිශය තරගකාරී පරිසරය හා අපගේ තරගකරුවන් විසින් පිරිනමන්නා වූ අනෙකුත් නිෂ්පාදනයන්ගේ ස්වභාවයත් අපගේ සේවාදායකන්ගේ ඉහළ අවශ්‍යතාවයනුත් අනුව හඳුනාගන්නා ලද ප්‍රධාන ක්ෂේත්‍රයන් පහත පරිදි වේ.

1. සරල සහතික පාඨමාලාවෙන් ආරම්භ වී උසස් ඩිප්ලෝමාව මට්ටමේ වැඩසටහන් දක්වා ප්‍රවේශ වීමට හා බැහැර වීමට පහසු මං සහිතව සිසුනට සිය වෘත්තිය මාර්ගය සම්පූර්ණ කරගැනීමට ඉඩ සැලසීම.

2. ප්‍රාදේශීය මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම හා ධාරිතා වර්ධනය.

3. කළමනාකාරීත්වයට හා කළමනාකරණ තොරතුරු පද්ධතියට සම්බන්ධව උපදේශන සේවා ඒකක ස්ථාපිත කිරීම.

4. යටිතල පහසුකම් හා උපකරණ වැඩිදියුණු කරමින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීම.

5. කොළඹ හා ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සේවාලාභීන් හා කාර්ය මණ්ඩලය සඳහා ලොව පිළිගත් මට්ටමේ අධ්‍යයන, විනෝද කටයුතු හා ආපන ශාලා පහසුකම් ලබාදීම.

6. මානව සම්පත් හා පරිපාලනය සඳහා පරිපාටි සංග්‍රහයක් සැකසීම.

7. රජයේ ආයතනයන් හා තරගකරුවන් හා සම වන සේ වැටුප් සංශෝධන ඇති කිරීම

8. පිවිසුම් සහ පිටවුම් පහසු කරන යෝජිත වෘත්තීය මාර්ගයක් සංවර්ධනයට ගැළපෙන ආකාරයෙන් පවත්නා සහතික හා ඩිප්ලෝමා පාඨමාලා සමාලෝචනය හා යාවත්කාලීන කිරීම.

9. අපගේ නිෂ්පාදන හා සේවාවන්ගේ තත්ත්වය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම.

10. ප්‍රකාශන හා සඟරා
    - කාර්තුමය/වාර්ෂික ලෙස ආයතනය තුළ සඟරා පළ කිරීම
    - ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා සිසුන්ගේ ඉහළ මට්ටමේ ව්‍යාපෘති වාර්තා ප්‍රකාශයට පත් කිරීම.

11. සහය සේවාවන්ගේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.

අංශවල ව්‍යුහය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශවලින් අප වෙත පැමිණෙන සේවාලාභීන්ට ඵලදායී ලෙස සේවා සැපයීම හා ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතියේ නිපුණතා හා හැකියාවන්ගෙන් යුත් ශ්‍රම බළකායක් ඇති කිරීමේ අරමුණ ඇතිව, මෙම ආයතනයේ මෙහෙයුම් කටයුතු අංශ දෙකක් ලෙසින් ව්‍යුහගත කොට ඇත. එම ප්‍රධාන අංශයන් නම්:

- ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය
- කළමනාකරණ තොරතුරු පද්ධති අංශය

ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය

ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය විසින් රාජ්‍ය හා පුද්ගලික අංශයන් සඳහා විවිධ විෂයයන්ට අදාළ උපාධි පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමේ අවස්ථාව සලසා දී ඇත.

- කළමනාකරණ සංවර්ධන වැඩසටහන්.
- ඵලදායිතා හා ගුණත්ව වර්ධන වැඩසටහන්
- උපදේශන සේවා
- භාෂා වැඩසටහන්
- පරිගණක යෙදවුම් වැඩසටහන්
- විශේෂ ලෙස සකසන ලද පුහුණු වැඩසටහන්

මෙහි ප්‍රධාන අරමුණ නම් ව්‍යාපාර ආයතනය හා පුද්ගලයින්ගේ ඵලදායිතා හා කළමනාකරණ භාවිතය සංවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සලැසීමයි. මෙම අංශය මගින් පුහුණු, අධ්‍යාපන හා උපදේශන සේවා යන ක්ෂේත්‍රයන්ට අදාළව පුළුල් පරාසයකින් යුත් නිපැයුම් පිරිනමනු ලබයි. මෙමගින් පාසල් හැරයන්නන්ගේ සිට ඉහළ මට්ටමේ ව්‍යක්තිකයන් දක්වා පරාසයක් සඳහා සේවා සපයනු ලබයි. මෙම අධ්‍යාපන හා පුහුණු අවස්ථාවන් රාජ්‍ය හා පෞද්ගලික අංශවල මේ සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයන් හා ආයතන සඳහා නිර්දේශ කරනු ලැබේ.

දශක ගණනාවක් මුළුල්ලේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයතන සඳහා ඵලදායිතා හා තත්ත්ව කළමනාකරණ පද්ධති හඳුන්වාදීමේ ප්‍රමුඛස්ථානයක් උසුලයි. මැතක දී මෙම අංශය මගින් Lean manufacturing and six sigma systems යන ලොව පිළිගත් ඵලදායිතා හා ගුණත්ව වර්ධන ක්‍රම හඳුන්වා දෙන ලදී. Lean and six sigma systems භාවිතා කොට ශ්‍රී ලංකාවේ කර්මාන්ත විශාල ප්‍රමාණයක් තම තත්ත්ව හා ඵලදායිතාවය වර්ධනය කරගැනීමට යොමු වී ඇත.

මෙම අංශය එහි උපදේශන කටයුතු සම්බන්ධව ඉහළ මට්ටමක විශේෂඥතාවයක් පෙන්නුම් කරයි. අපගේ උපදේශනයන්, සියලුම කරුණු හා අදහස් පිළිබඳ වාස්තවික විශ්ලේෂණයක් මත පදනම් වූ ස්වාධීන උපදේශනයකි. අභ්‍යන්තර හා බාහිර ව්‍යක්තිකයන්ගේ සමන්විත ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයනයේ උපදේශන කණ්ඩායම, ඕනෑම උපදේශන ව්‍යාපෘතියක් මෙහෙයවීමට හැකි පරිදි තාක්ෂණික හා කළමනාකරණ නිපුණතායෙන් ද, මනා පරිචයක් සඳහා අවශ්‍ය පළපුරුද්ද හා අත්දැකීම්වලින් ද පොහොසත් ය.

පුහුණු වැඩසටහන්

2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය විසින් වැඩසටහන් 99 ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් සඳහා ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් 02 ක් උසස් ඩිප්ලෝමා වැඩසටහන් 20 ක්, ඩිප්ලෝමා වැඩසටහන් 04 ක්, උසස් සහතික පත්‍ර වැඩසටහන් 27 ක්, සහතිකපත්‍ර වැඩසටහන් 15 ක්, පදනම් වැඩසටහන් 06 ක් අභ්‍යන්තර වැඩසටහන් 10 ක් හා කෙටිකාලීන වැඩසටහන් 15 ක් ඇතුළත් ය.

2013 හා 2014 වර්ෂයන් තුළ ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය විසින් පවත්වන ලද වැඩසටහන්වල සාරාංශය පහත වගුවෙන් දැක්වේ.

	වැඩසටහන් වර්ගය	2013		2014	
		පාඨමාලා ගණන	සහභාගිවූවන් ගණන	පාඨමාලා ගණන	සහභාගිවූවන් ගණන
1	ඉහළ ඩිප්ලෝමා වැඩසටහන්	1	178	2	395
2	උසස් ඩිප්ලෝමා වැඩසටහන්	20	1,396	20	1,191
3	ඩිප්ලෝමා වැඩසටහන්	4	114	4	89
4	උසස් සහතිකපත්‍ර වැඩසටහන්	27	1,197	27	1,007
5	සහතිකපත්‍ර වැඩසටහන්	18	550	15	489
6	පදනම් වැඩසටහන්	8	336	6	224
7	කෙටිකාලීන වැඩසටහන්	17	359	15	381
8	අභ්‍යන්තර වැඩසටහන්	11	248	10	228
	Total	**106**	**4,378**	**99**	**4,004**

වගුව 04 ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් පවත්වන ලද වැඩසටහන්



ප්‍රස්තාරය 04: ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් පවත්වන ලද පාඨමාලා

2014 වසර තුළ 4,004 ක ප්‍රමාණයක් ඵලදායිතා හා කළමනාකරන සංමවර්ධන අංශයේ වැඩසටහන් සඳහා සහභාගි වූහ. මෙයින් 395 ක් ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ද, 1,191 ක් උසස් ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ද, 89 ක් ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ද, 1,007 ක් උසස් සහතිකපත්‍ර පාඨමාලා සඳහා ද, 489 ක් සහතිකපත්‍ර පාඨමාලා සඳහා ද, 224 ක් පදනම් පාඨමාලා සඳහා ද, 609 ක් කෙටි කාලීන වැඩසටහන් සඳහා ද සහභාගි විය.

ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශයේ සංවර්ධන ප්‍රයත්නයන්

පෞද්ගලික අංශයේ සේවාලාභීන්ගේ අවශ්‍යතාවන්ට අනුව පුහුණු වැඩසටහන් සැකසීමට විවිධ උත්සාහයන් ගන්නා ලදී. ඒ අනුව මෙම වසර තුළ නව පුහුණු වැඩසටහන් හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන් අතරින් ඵලදායිතාව හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් හඳුන්වා දෙන ලද පාඨමාලා ප්‍රධාන වේ. වසර තුළ ඉංග්‍රීසි භාෂා පුහුණුව පිළිබඳ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. නව වැඩසටහන් සැකසීම සඳහා ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.

- පාරිභෝගික ඇගයීම් පද්ධතිය ස්ථානපනය හා වැඩිදියුණු කිරීම
- පාරිභෝගිකයන් සඳහා යාවත්කාලීන දත්ත බැංකුවක් පවත්වාගෙනයාම හා ඔවුන් අතර ආයතනයේ කීර්තිනාමය වර්ධනය කිරීම.
- නව වෙළෙඳ ප්‍රචාරණ ක්‍රමවේද හඳුන්වාදීම.
- පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සැපිරීමට හැකි ආකාරයේ වැඩසටහන් ප්‍රවර්ධනය
- අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහාවිශේෂ අවධානයක් යොමු කිරීම

ඉංග්‍රීසි භාෂා ඒකකය

ඉංග්‍රීසි භාෂා ඒකකය එක් පූර්ණකාලීන උපදේශකයකුගෙන් යුක්තව 2006 නොවැම්බර් මස ස්ථාපනය කරන ලදී. දැන් එම ඒකකය පූර්ණකාලීන උපදේශකයන් තිදෙනෙකුගෙන් යුක්තව ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ යටතේ ක්‍රියාත්මක වේ. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය සියලුම ආකාරයේ ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතාව වර්ධනය කිරීම සඳහා ප්‍රසිද්ධියක් උසුලන අතරම, පුද්ගලික හා රාජ්‍ය අංශවල සේවකයන් සඳහා ඉංග්‍රීසි භාෂා වැඩසටහන් හා අභ්‍යන්තර ඉංග්‍රීසි භාෂා වැඩසටහන් සාර්ථක ලෙස පවත්වා ඇත.

ගුණාත්මක ඉංග්‍රීසි භාෂා වැඩසටහන් සඳහා දිනෙන් දින ඉහළ යන ඉල්ලුමට සරිලන පරිදි, සහභාගි වන්නන්ට ඉංග්‍රීසි භාෂා භාවිතය පිළිබඳ දක්ෂතාවය වර්ධනය කරගැනීමට හැකි ලෙස සහතික පත්‍ර මට්ටමේ සිට ඩිප්ලෝමා මට්ටම දක්වා වැඩසටහන් කිහිපයක්ම ඉංග්‍රීසි ඒකකය විසින් සැලසුම් කොට ඇත. සාර්ථක වෘත්තිය ගමන් මඟක් සඳහා ශක්තිමත් පදනමක් ලෙස ඉංග්‍රීසි භාෂා ශක්‍යතාවය වර්ධනය කර ගැනීමට උනන්දුවක් දක්වන අයට මෙම වැඩසටහන් ඉතා යෝග්‍ය වේ. ඉංග්‍රීසි ඒකකය විසින් දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි හදාරන සියලුම ආකාරයේ සිසුන් හැසිරවීමේ මනා අත්දැකීම් ඇති, සුදුසුකම්ලත් සම්පත්දායකයින්ගේ සේවාව ලබාගනී. සන්නිවේදන මාධ්‍යයක් ලෙස ඉංග්‍රීසි භාෂාව විශ්වාසයෙන් යුතුව භාවිතා කිරීම සඳහා ශිෂ්‍යයින්ට ඔවුන්ගේ මඟ පෙන්වීම ඉතා වැදගත් ය. නව ඉංග්‍රීසි භාෂා ඒකකය රට තුළ හා ක්ෂේත්‍රය තුළ ඉංග්‍රීසි භාෂා ශක්‍යතාවය පිළිබඳ පුහුණුව සපයන ස්ථානයක් ලෙස කටයුතු කරන අතරම, අනෙකුත් දේශීය හා විදේශීය භාෂා පිළිබඳ භාෂා සංවර්ධන වැඩසටහන් පුළුල් කිරීමේ සැලැස්මක් ද එම ඒකකයට ඇත.

ආදායම් උත්පාදනය

2014 වසර තුළ ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය රු. මි. 272 ක ආදායමක් උපයා ගන්නා ලදි. පසුගිය වර්ෂයන් සමඟ සන්සන්දනය කර බැලීමේ දී ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශයේ ආදායම් ඉපයීම්වල සැලකිය යුතු මට්ටමක වර්ධනයක් ඇති බව පහත දැක්වෙන වගුවෙන් හා ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.

ආදායම් උත්පාදනය ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය

රු මිලියන

	2010	2011	2012	2013	2014
ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් උපයන ලද ආදායම	216	327	232	253	272

වගුව 05 ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් උපයන ලද ආදායම



ප්‍රස්තාරය 05 ඵලදායිතා හා කළමනාකරණ සංවර්ධන අංශය මගින් උපයන ලද ආදායම

කළමනාකරණ තොරතුරු පද්ධති අංශය

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම් හා පුහුණුව ලබාදීමේ පුරෝගාමී ආයතනය වේ. මෙම අංශය විසින්, සහභාගිවන්නන් සඳහා පිළිගත් සුදුසුකම් ලබාගැනීමට හා රැකියාවක් සඳහා අවශ්‍ය නිපුණතා ලබාගැනීම හැකිවන පරිදි පරිගණක වැඩසටහන් පවත්වනු ලබයි. නවීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි පාඨමාලා මොඩියුලයන් නිතිපතා යාවත්කාලීන කරනු ලබයි.

මෙම අංශය මගින් ඉහළ ඩිප්ලෝමා, ඩිප්ලෝමා වැඩසටහන් හා සහතකි පත්‍ර පාඨමාලා කිහිපයක් පවත්වනු ලබයි. මෙහි ප්‍රධාන පරිගණක වැඩසටහන් වන්නේ පරිගණක පද්ධති සැලසුම් (Computer system design) පිළිබඳ එක් අවුරුදු පාඨමාලාව පරිගණක පදනම් කරගත් තොරතුරු පද්ධති (Computer based information systems) පිළිබඳ වසර 2 ක ඉහළ ඩිප්ලෝමා වැඩසටහන් යනාදියයි. මෙලෙස මැනවින් ව්‍යුහගත කරන ලද පරිගණක පුහුණු වැඩසටහන්, ශිෂ්‍යයන් අතර මෙන්ම දේශීය හා විදේශීය සේවායෝජකයින් අතර ද මනා පිළිගැනිමකට පාත්‍රව ඇත.

2006 මැයි මස සිට කළමනාකරණ තොරතුරු පද්ධති අංශය අන්තර්ජාතික පරිගණක සහතික බලපත්‍රය (International computer driviry license) සඳහා පුහුණුව පිළිබඳ සහතික කළ විභාග මධ්‍යස්ථානයක් ලෙස පිළිගනු ලැබී ය. 2008 වසරේ සිට මෙම අංශය මගින් ලබාදුන් ගුණාත්මක අධ්‍යාපන හා සේවාවන් පිළිගැනීමකට ලක්කරමින්, මෙම අංශය විසින් ISO 9001:2000 සහතිකය දිනාගන්නා ලදී..

කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ වෙනත් ක්‍රියාකාරකම්

මෙම අංශය මගින් 2014 වසරේ දී වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. එනම් ඩිප්ලෝමා වැඩසටහන් 14 ක් උසස් ඩිප්ලෝමා වැඩසටහන් 02 ක් පරිගණක සහතිකපත්‍ර වැඩසටහන් 22 ක් වෙනත් වැඩසටහන් 06 ක් යනාදී වශයෙනි.

කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් පවත්වන ලද වැඩසටහන්

		2013		2014	
	වැඩසටහන් වර්ගය	පාඨමාලා ගණන	සහභාගි වූවන් ගණන	පාඨමාලා ගණන	සහභාගි වූවන් ගණන
1	උසස් ඩිප්ලෝමා පාඨමාලා	2	280	2	337
2	ඩිප්ලෝමා පාඨමාලා	10	763	14	609
3	සහතිකපත්‍ර පාඨමාලා	19	931	22	919
4	වෙනත්	10	207	6	142
	එකතුව	**41**	**2,181**	**44**	**2,007**

වගුව 06 කළමනාකරන තොරරතුරු පද්ධති අංශය මගින් පවත්වන ලද වැඩසටහන්



ප්‍රස්ථාරය 06 කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් පවත්වන ලද වැඩසටහන්

ආදායම් උත්පාදනය

2014 වසර තුළ කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් උපයන ලද ආදායම රු.මි. 159 කි. පහත දැක්වෙන 07 වගුව මගින් 2014 වසරේ උපයන ලද ආදායම එයට පෙර වසරවලට වඩා අඩු වී ඇති බව පෙන්නුම් කෙරේ.

ආදායම් උත්පාදනය කළමනාකරණ තොරතුරු පද්ධති අංශය

රු මිලියන

	2010	2011	2012	2013	2014
කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් උපයන ලද ආදායම	184	245	152	166	159

වගුව 07 කළමනාකරණ තොරතුරු පද්ධති අංශය මගින් උපයන ලද ආදායම



ප්‍රස්ථාරය 07 කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් උපයන ලද ආදායම

ප්‍රාදේශිය මධ්‍යස්ථාන

කළමනාකරණ පුහුණුව ප්‍රාදේශිය මට්ටමක ගෙනයමින්, 2014 වසර වන විට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ප්‍රාදේශීය මධ්‍යස්ථාන තුනක් ආරම්භ කොට ඇත.

කුරුණෑගල ප්‍රාදේශිය මධ්‍යස්ථානය

1986 දී විවෘත කරන ලද කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන පාඨමාලා වනුයේ: පරිගණක පද්ධති නිර්මාණය පිළිබඳ පූර්ණකාලීන ඩිප්ලෝමා පාඨමාලාව හා ඉහළ ඩිප්ලෝමා පාඨමාලාව, පරිගණක යෙදවුම් පිළිබඳ ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ හා ව්‍යාපාර කළමනාකරණය ඩිප්ලෝමා පාඨමාලා, පදනම් පාඨමාලා, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා, උසස් සහතික පත්‍ර හා සහතික පත්‍ර පාඨමාලා.

මෙම වැඩසටහන් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා 2008 ඔක්තෝබර් 31 වන දින නව ගොඩනැගිල්ලක් විවෘත කළ අතර, එම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි. 141 විය. එය මහල් හතරකින් යුතු ගොඩනැගිල්ලක් වන අතර පහත දැක්වෙන පහසුකම්වලින් සමන්විත ය.

- සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විත දේශන ශාලා.
- අවශ්‍ය සියලු උපකරණවලින් සමන්විත පරිගණක පර්යේෂණ විද්‍යාගාරයක්
- නවීන ශ්‍රවණාගාරයක්
- පුස්තකාලයක්
- අන්තර්ජාල හා බ්‍රෝඩ්බෑන්ඩ් (Broadband) පහසුකම්
- සුබසාධන හා ආපනශාලා පහසුකම්
- සියලු පහසුකම් සහිත බද්ධ නිවාස දෙකක්
- වාහන නැවැත්වීමේ පහසුකම්

2013 හා 2014 වසර තුළ කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දී පහත දැක්වෙන පාඨමාලා පවත්වන ලදී.

		2013		2014	
	පාඨමාලා වර්ගය	පාඨමාලා ගණන	සහභාගිවූවන් ගණන	පාඨමාලා ගණන	සහභාගිවූවන් ගණන
1	ඉහළ ඩිප්ලෝමා වැඩසටහන්	3	123	4	131
2	ඩිප්ලෝමා වැඩසටහන්	8	357	10	305
3	උසස් සහතිකපත්‍ර පාඨමාලා	11	413	9	251
4	සහතිකපත්‍ර පාඨමාලා	12	378	11	322
5	පදනම් වැඩසටහන්	6	175	5	100
6	අභ්‍යන්තර වැඩසටහන්	1	13	2	57
	එකතුව	**42**	**1,459**	**41**	**1,166**

වගුව 08 කුරුණෑගල මධ්‍යස්ථානයේ දී පවත්වන ලද වැඩසටහන්



ප්‍රස්ථාරය 08 කුරුණෑගල මධ්‍යස්ථානයේ දී පවත්වන ලද වැඩසටහන්

ආදායම් උත්පාදනය

කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ කළමනාකරණ සංවර්ධන අංශය හා කළමනාකරණ තොරතුරු පද්ධති අංශය රු. මිලියන 81 ආදායමක් 2014 වසරේ දී උපයා ගන්නා ලදී. කුරුණෑගල මධ්‍යස්ථානයේ ආදායම සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇති බව පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

ආදායම් උත්පාදනය කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය

	2010	2011	2012	2013	201
කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් උපයන ලද ආදායම	54	61	66	79	81

වගුව 09 කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් උපයන ලද ආදායම



ප්‍රස්ථාරය 09 කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් උපයන ලද ආදායම

මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය

පරිගණක හා කළමනාකරණ සංවර්ධන අධ්‍යාපනය සඳහා මධ්‍යම පළාතේ වැඩිවන ඉල්ලුම සපුරාලීමට 1996 වසරේ දී මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය (පේරාදෙණිය මාර්ගයේ පිහිටි) ආරම්භ කරන ලදි. පසුව මෙම මධ්‍යස්ථානය වඩාත් ඉඩ පහසුකම් හා නවීන පහසුකම්වලින් සමන්විත අස්ගිරිය මාර්ගයේ පිහිටා ඇති සිව්මහල් ගොඩනැගිල්ලක ස්ථාපනය කරන ලදී. අධ්‍යාපනයට වඩාත් උචිත පහසුකම් හා පරිසරයකින් සමන්විත මෙම මධ්‍යස්ථානය වඩා යහපත් ප්‍රතිඵල ළඟා කරදෙනු ඇතැයි අපේක්ෂිත ය. මෙම මධ්‍යස්ථානයේ කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ වැඩසටහන් කිහිපයක් පවත්වනු ලබයි. මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ 2013 හා 2014 වසර තුළ පවත්වන ලද පාඨමාලා පහත සාරාංශ කර ඇත.

	පාඨමාලා වර්ගය	2013		2014	
		පාඨමාලා ගණන	සහභාගිවූවන් ගණන	පාඨමාලා ගණන	සහභාගිවූවන් ගණන
1	උසස් ඩිප්ලෝමා වැඩසටහන්	3	86	4	199
2	ඩිප්ලෝමා වැඩසටහන්	10	486	11	431
3	උසස් සහතිකපත්‍ර පාඨමාලා	10	412	11	315
4	සහතිකපත්‍ර පාඨමාලා	10	390	11	368
5	පදනම් වැඩසටහන්	4	234	4	105
6	අභ්‍යන්තර පුහුණු වැඩසටහන්	-	-	3	10
	එකතුව	**37**	**1,608**	**44**	**1,428**

වගුව 10 මහනුවර මධ්‍යස්ථානයේ පවත්වන ලද පාඨමාලා



ප්‍රස්ථාරය 10 මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දී පැවැත්වූ පාඨමාලා

ආදායම් උත්පාදනය

මහනුවර ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ කළමනාකරණ සංවර්ධන අංශය සහ කළමනාකරණ තොරතුරු පද්ධති අංශය 2014 වසර තුළ උපයන ලද ආදායම රු. මිලියන 85 කි. මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම වසරින් වසර ඉහළ ගොස් ඇති බව පහත වගුව මගින් පෙනීයයි.

ආදායම් උත්පාදනය මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය

රු. මිලියන

	2010	2011	2012	2013	2014
මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම	23	35	53	78	85

වගුව 11 මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම



ප්‍රස්තාරය 11 ආදායම් උත්පාදනය මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය

ගාල්ල ප්‍රාදේශිය මධ්‍යස්ථානය

දකුණු පළාත සඳහා කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ අධ්‍යාපන පහසුකම් සැපයීම අරමුණු කරගෙන මෙම මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. එය අලුතින් ඉදිකරන ලද. සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විත ආයතනයක් වන අතර, ආයතනයෙන් උසස් අධ්‍යාපනය ලැබීමට පැමිණෙන සියලු ශිෂ්‍යයන් සඳහා පියවරෙන් පියවර අධ්‍යාපනය හා වෘත්තිය මාර්ග විවරකරදීම සහතික කරයි. 2010 දී ආරම්භ කළ ගාල්ල මධ්‍යස්ථානයේ දී කළමනාකරණ හා තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයන්ට අදාළ උපාධි වැඩසටහන්, ඩිප්ලෝමා වැඩසටහන්, සහතික පත්‍ර වැඩසටහන්, අභ්‍යන්තර වැඩසටහන්, වැඩමුළු හා පුහුණු වැඩසටහන් හැදෑරීමේ හැකියාව ඇත. මෙම ප්‍රදේශයන් හි දිනෙන් දින ඉහළ යන පුහුණු හා අධ්‍යාපන අවශ්‍යතා සැපිරීම සඳහා ලොව පිළිගත් පහසුකම් සහිත අධ්‍යාපන පරිසරයක් තුළ, ගුණාත්මක බවින් යුතු වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අවස්ථා ග්‍රාමීය ප්‍රදේශවලට ලබාදීමේ අරමුණ ඇතිව ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය වැඩසටහන් ව්‍යාප්ත කිරීම ආරම්භ කොට ඇත. ඉහත කී අරමුණ පෙරදැරි කරගෙන, තරුණ ප්‍රජාවගේ අපේක්ෂාවන් හා ක්ෂේත්‍රය තුළ සුදුසුකම් ලත් හා පුහුණුව ලත් පුද්ගලයන්ට පවතින ඉල්ලුම සැපිරීම සඳහා, අනාගතයේ දී ප්‍රධාන නගරවල ප්‍රාදේශිය මධ්‍යස්ථාන ඉදිකෙරෙනු ඇත. 2013 හා 2014 වර්ෂයන් තුළ ගාල්ල මධ්‍යස්ථානයේ දී පහත දැක්වෙන වැඩසටහන් පවත්වන ලදී.

		2013		2014	
	පාඨමාලා වර්ගය	පාඨමාලා ගණන	සහභාගි වූ ගණන	පාඨමාලා ගණන	සහභාගි වූ ගණන
1	උසස් ඩිප්ලෝමා පාඨමාලා	3	134	4	111
2	ඩිප්ලෝමා පාඨමාලා	10	419	11	385
3	උසස් සහතිකපත්‍ර පාඨමාලා	12	406	14	356
4	සහතික පත්‍ර පාඨමාලා	9	276	8	251
5	පදනම් පාඨමාලා	4	93	4	67
	එකතුව	**38**	**1,328**	**41**	**1,170**

වගුව 12 ගාල්ල මධ්‍යස්ථානයේ දී පවත්වන ලද පාඨමාලා



ප්‍රස්ථාරය 12 ගාල්ල ප්‍රාදේශිය මධ්‍යස්ථානයේදී පවත්වන ලද පාඨමාලා

ආදායම් උත්පාදනය

ගාල්ල මධ්‍යස්ථානයේ කළමනාකරණ සංවර්ධන හා තොරතුරු පද්ධති අංශය විසින් උපයන ලද ආදායම රු. මිලියන 82 කි. ගාල්ල මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම 2014 වර්ෂය තුළ ඉහළ ගොස් ඇති බව පහත වගුව මගින් පෙන්නුම් කෙරේ.

ආදායම් උත්පාදනය ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය

රු.මිලියන

	2010	2011	2012	2013	2014
ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම	32	48	62	83	82

වගුව 13 ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන පාඨමාලා



ප්‍රස්තාරය 13 ආදායම් උත්පාදනය ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය

පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය







ශිෂ්‍යයන්ගේ හා ගුරු මණ්ඩලයේ පරිශීලන අවශ්‍යතාවන් සැපිරීම සඳහා අවශ්‍ය පහසුකම් සියල්ලෙන්ම සපිරි පුස්තකාලයක් මෙම ආයතනය සතු ය.

අරමුණු

පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ අරමුණු වන්නේ, දැනුම හා කාර්යක්ශමතාව වර්ධනය කිරීමට අවශ්‍ය තොරතුරු සැපයීම, ආයතනය මගින් ආවරණය කරනු ලබන පුහුණු ක්ෂේත්‍රයට අවශ්‍ය තොරතුරු ලබා දීම හා උපදේශන සේවා සඳහා පහසුකම් සැපයීම සඳහා ප්‍රමාණවත් සම්පත් සැපයීම යනාදියයි.

වර්ගීකරණ ක්‍රමය

පුස්තකාලය විසින් භාවිතා කරන වර්ගීකරණ ක්‍රමය 'විශ්ව දශම වර්ගීකරණය'යයි. 1990 අප්‍රේල් මස දී මෙම පුස්තකාලය යුනෙස්කෝව (UNESCO) මගින් හඳුන්වා දුන් පරිගණක පාදක කරගත් ග්‍රන්ථ විද්‍යාත්මක වර්ගීකරණය භාවිත කිරීම ආරම්භ කරන ලදි. මේ සඳහා Micro CD's/ ISIS හා Winsis මෘදුකාංග පැකේජයන් අයත් වේ. මෙහිදී, Visual Basic ක්‍රමය Access නව අනුවාදය සමඟ භාවිතා කරනු ලැබේ. පුස්තකාලය, සාමාන්‍ය සතියේ කාර්යාල වේලාව තුළ දී මෙන්ම සෙනසුරාදා හා ඉරිදා දිනවල දී ද විවෘතව තබයි.

විෂයයන්

ව්‍යාපාර කළමනාකරණය, ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය, කාර්මික ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව, අලෙවි කළමනාකරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාරික නීතිය, සුළු පරිමාන කර්මාන්ත, පර්යේෂණ ක්‍රම පුහුණුව, මනෝ විද්‍යාව, සංඛ්‍යානය, පරිගණක විද්‍යාව, සන්නිවේදනය, ඵලදායිතාව, මහජන සම්බන්ධතා, කාර්යාල පරිපාලනය, ඉලෙක්ට්‍රොනික, ඉංග්‍රීසි හා දෙමළ භාෂා යන විෂයයන් ආයතනයේ අධ්‍යාපනික වැඩසටහන් යටතේ ආවරණය කරනු ලබන විෂයයන් වේ.

සේවා

පුස්තකාලය මගින් ග්‍රන්ථ විමර්ශන කිරීමේ හා බැහැර රැගෙන යාමේ පහසුකම් සපයනු ලැබේ. සුචිපත්‍ර සංසරණය, ප්‍රතිග්‍රහණ ලයිස්තු, සඟරාවල පටුන පිටු සේවා යනාදිය මෙමගින් ලබාදෙන අනෙකුත් සේවා වේ. පුස්තකාලයේ දත්ත පද්ධතිය භාවිතා කොට තොරතුරු සොයාගැනීම ද ඇතුළු වරණීය තොරතුරු ලබාදීම ද පුස්තතාලය මගින් සිදුවන අතර දැනුවත් කිරීමේ සේවාවන් ද සපයනු ලබයි. අන්තර් පුස්තකාල ග්‍රන්ථ බැහැරදීමේ ක්‍රමවේදය, ප්‍රලේඛණ සේවය, ඡායා පිටපත් සේවය, තොරතුරු හා උපදෙස් සේවා, අන්තර්ජාලයට නොමිලේ පිවිසීමේ පහසුකම, හා විද්‍යුත් තැපැල ඔස්සේ තොරතුරු සමුද්ධරණය යනාදි ප්‍රතිලාභ ද පුස්ථකාලය පරිහරනය කරන්නට හිමිවේ.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය පිළිබඳ තොරතුරු අඩංගු වාර්තා ද ඇතුළුව පුවත්පත් ලිපි එක්රැස් කිරීම, සුචිපත්‍ර සම්පාදනය, ග්‍රන්ථ ප්‍රදර්ශන පැවැත්වීම, තොරතුරු හුවමාරු කිරීමේ සේවා, අන්තර් පුස්තකාල සම්බන්ධතා හා තොරතුරු සැකසීම සඳහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සහාය ලබාදීම, යනාදිය පුස්තකාලයේ විශේෂ කාර්යයන් වේ.

සම්පත්

ග්‍රන්ථ සංඛ්‍යාව

කාණ්ඩයන්	2013	2014
ග්‍රන්ථ (කොළඹ ප්‍රධාන ශාඛාව)	26,748	27,064
කුරුණෑගල, ගාල්ල හා මහනුවර ශාඛා මගින් ලබාගත් ග්‍රන්ථ	3,302	3,850
උපදේශන වාර්තා	200	200
පුවත්පත් ලිපි එකතුව	530	560
දෘෂ්‍ය සම්පත් එකතුව	71	71
වාර සඟරා (දැනට ලබාගැනීම්)	65	65
වාර සඟරා එකතුව	175	175
ශ්‍රව්‍ය සම්පත් එකතුව	30	30
සිතියම්	10	100
ව්‍යාපෘති වාර්තා	4,560	4,560
පොත් පිංච	90	90
සංයුක්ත තැටි	560	580

විශේෂ එකතුවන්

- ශ්‍රී ලංකා එකතුව
- ආසියා ඵලදායිතා සංවිධානයේ ප්‍රකාශන එකතුව
- සමාගම් වාර්ෂික වාර්තා
- පුහුණු කටයුතුවලට අදාළ තොරතුරු
- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ උපදේශන වාර්තා
- වාර සඟරා එකතුව
- ශිෂ්‍යයන්ගේ ව්‍යාපෘති වාර්තා
- ශ්‍රව්‍ය/දෘෂ්‍ය තොරතුරු එකතුව
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රකාශන
- දෙමළ භාෂාව පිළිබඳ ප්‍රකාශන
- ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ ප්‍රකාශන

2014 වසර තුළ පුස්තකාලයට මිලදී ගත් ග්‍රන්ථ

2014 වසර තුළ ප්‍රසම්පාදන තොරතුරු පහත පරිදි වේ.

201 දී මිලදී ගත් ග්‍රන්ථවල වටිනාකම	Rs. 381,616.58
2014 දී මිලදී ගත් වාර සඟරාවල වටිනාකම	Rs. 252,084.15
එකතුව	**Rs. 633,700.73**

වෘත්තීය මාර්ගෝපදේශණ ඒකකය Guidance Unit

උපාධි ශිෂ්‍යයකු තම අධ්‍යාපන හා පුහුණු අවස්ථාවේදී හෙළදරව්කරගත යුතු / අනාවරණය කරගත යුතු ඉතා වැදගත් කොටසකී වෘත්තීය මාර්ගෝපදේශකත්වය. වත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තම ක්ෂේත්‍රයට අදාල වූ වත්තිකයන් සොයා ගැනීම පිණිස අවශ්‍ය සහාය සහ උපදේශණය ලබාදෙයි. මෙම ඒකකයේ ප්‍රධාන අරමුණු වී ඇත්තේ වෘත්තියන්ට අනුබද්ධිත වූ කුසලතාවයන් වන නායකත්වය, සාමූහිකව වැඩ කිරීමේ කුසලතාවයන්, සංනිවේදන කුසලතාවයන්, කළමනාකරණ කුසලතාවයන්, අලෙවිකරණ සහ ව්‍යවසායකත්ව කුලසතාවයන් සංවර්ධනය කිරීමයි.

වෘත්තීය මාර්ගෝඋදේශණ ඒකකයේ කාර්යයන්

- උපාධි සහ උසස් ඩිප්ලෝමා සිසුන් කර්මාන්ත ක්ෂේත්‍රයේ පුහුණුවට යොමු කිරීම.
- වෘත්තීය සංවර්ධන සැළසුම් සකස් කිරීම සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මගින් සිසුන්ට සහයෝගය දැක්වීම සහ ඔහුන්ව අධීක්ෂණය කිරීම.
- සිසුන්ගේ වෘත්තීය මාවත සඳහා අවශ්‍ය තාත්වික අරමුණු සහ ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීමට දිරිමත් කිරීම.



- හැකියාවන් සහ පුහුණුව අතර පවතින පරතරය හඳුනාගැනීම තුළින් වෘත්තීය සංවර්ධනය සැලසීමට උපදෙස් සහ උපකාර කිරීම.

විභාග අංශය

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ විභාග අංශය 2007 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. විභාග පැවැත්වීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය වේ. එම නිසා විභාග අංශය සිසුන්ගේ රහස්‍යභාවය රකිමින් විශාල වගකීමක් දරයි. ප්‍රශ්ණ පත්‍ර සහ එහි රහස්‍යභාවය සුරැකීම එසේම පූර්ණ ආරක්ෂාව යටතේ විභාග අංශයේ සියලුම සේවකයින්ගේ කැපවීම යටතේ ආරක්ෂිතතව සහ විශ්වාසනීයත්වය යටතේ විභාග පැවැත්වීම සිදුකරයි.

විභාග අංශයේ කාර්යයන්

- ආයතනික නීති සහ රෙගුලාසිවලට අනුව විභාග පැවැත්වීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම
- විභාග සම්බන්ධව සියලු සිසුනන්ගේ වාර්තා කළමනාකරණය කිරීම
- ප්‍රාදේශිය මධ්‍යස්ථානවල සියලු වාර්තා කළමනාකරණය කිරීම
- විභාග සමීක්ෂණ අවශ්‍යතා කළමනාකරණය කිරීම

වෛද්‍ය මධ්‍යස්ථානය

ආයතනයේ පාඨමාලාවන් හදාරන සිසුන්ගේ සහ සේවක මහත්ම මහත්මීන්ගේ සෞඛ්‍ය සහ මානසික තත්වය යහපත් ආකාරයෙන් පවත්වාගැනීම උදෙසා වෛද්‍ය මධ්‍යස්ථානය ආරම්භ කර ඇත. එමගින් එම් බී බී එස් සහතිකලත් වෛද්‍යවරියකගේ සහ හෙදියකගේ සේවය නිරන්තරයෙන් සලසනු ලැබේ.





කොරියානු සහයෝගීතා තොරතුරු සංනිවේදන මධ්‍යස්ථානය (KADO)



කොරියානු සහයෝගීතා තොරතුරු සංනිවේදන මධ්‍යස්ථානය NIIBM ආයතනයේ පිහිටුවීම.
මෙම මධ්‍යස්ථානය අන්තර්ජාල පහසුකම් හා පරිගනක 30 කින් ඇතුලුව නවීන තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයකින්ද, ආසන 50 කින් සමන්විත වූ සම්මන්ත්‍රණ කාමරයක් සහ පරිපාලන කාර්යාලයකින්ද සමන්විත වේ. ඉතා සුළු මදුලකට මෙහිදී අප ආයතනයේ සියළුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අන්තර් ජාල පහසුකම් සමගින් නවීන පරිගනක පරිහරණයට ඉඩ සලසා ඇත.



ආපන ශාලාව





සියලු පහසුකම්වලින් සමන්විත ශිෂ්‍ය විවේකාගාරයක් හා ආපන ශාලාවක් ආරම්භ කොට ඇති අතර, ශිෂ්‍යයන්ට ඔවුන්ගේ විවේක කාලය ගත කිරීමට හා ආහාර පාන ලබාගැනීමට හැකිවන පරිදි සතියේ දින 7 තුළම එය විවෘතව පවතී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } වීටීවයි/එෆ්/එන්අයිබීඑම්/1/14/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 අගෝස්තු 11 දින

සභාපති,

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2014 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත සහ 1991 අංක 28 දරන සංශෝධිත පනතේ 24 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාලිත සමාගමේ ගිණුම් විගණනය කරන ලද්දේ එහි සාමාජිකයන් විසින් පත්කරන ලද වරලත් ගණකාධිකරණ ආයතනයකිනි.මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2015 නොවැම්බර් 03 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නෘ නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>මතය - සමූහය</u>

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

<u>මතය - ආයතනය</u>

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා

ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -16

සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් දැනට භාවිතයේ පවතින පිරිවැය රු.28,442,953 ක් වූ වත්කම් අයිතමයන් 70 ක සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

2.3 ලැබිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2කට වඩා වැඩි කාලයක සිට පවතින ණයගැති ශේෂය රු.696,186 ක් හා 2012 ජුනි 22 දින වසා දමන ලද යාපනයෙහි පිහිටි ගොඩනැගිල්ල සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදලින් රු.30,124 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව	**අනුකූල නොවීම**
(අ) 2010 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත 114 වගන්තිය	2013 හා 2014 වර්ෂවල දී ගෙවන ලද දිරි දීමනා සඳහා ගෙවිය යුතු උපයන විට බදු ගෙවීම් එම දිරි දීමනා ගෙවූ මාසයේ දී එකවර අඩු කිරීම සඳහා අනුප්‍රමාණ බදු වක්‍ර 2 අදාල කර ගනිමින් ගණනය කළ යුතු වුවත්, එම දිරි දීමනා මාස 12න් බෙදා වෙන වෙනම එක් එක් මාසයේ වැටුපට එකතු කර ගනිමින් සාමාන්‍ය බදු වක්‍ර 01 යටතේ උපයන විට බදුගෙවීම් ගණනය කර තිබුණි.

(ආ)	2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. 06 ඡේදය	වාර්ෂික අයවැය ඇස්තමේන්තු සීමාව ඉක්මවා සිදුකරනු ලබන අලෙවි ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය හා සැලසුම් අමාත්‍යවරයාගෙන් අවසරය ලබාගතයුතු වුවත් ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේ දී ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ඇස්තමේන්තුගත රු.37,500,000 ක් ඉක්මවා රු.9,802,706 ක් සඳහා වැයකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල- සමූහය

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 410,101,233 ක ශුද්ධ ලාභයක් (බදු පෙර) වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 500,954,657 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සඳහා මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.90,853,424 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේදී සමූහයේ ආදායම රු.218,651,066 ක වර්ධනයක් සිදුවී තිබුණද වැටුප් හා දීමනා රු.45,767,148 කින්ද උපදේශන හා පුහුණු වියදම් රු.192,313,498කින්ද, ක්ෂයවීම් ඇතුළුව ආයතන හා වෙනත් වියදම් රු.71,217,440 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

මූල්‍ය ප්‍රතිඵල - ආයතනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 240,026,097 ක ශුද්ධ ලාභයක් (බදු පෙර) වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 284,752,742 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.44,726,645 ක පිරිහීමක් දක්නට ලැබුණි.සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා රු.22,456,978 කින්ද, උපදේශන හා පුහුණු වියදම් රු.12,684,563 කින්ද, ආයතන හා වෙනත් වියදම් රු 7,723,305 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.18,374,088 කින් එනම් සියයට 2 කින් වැඩිවන විට සෘජු වියදම් රු.35,141,541 කින් එනම් සියයට 18 කින් වැඩිවී තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ දළ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.16,767,453 කින් එනම් සියයට 3.6 කින් අඩුවී තිබුණි.

(ආ) ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ කොළඹ ප්‍රධාන කාර්යාලය හා මහනුවර, කුරුණෑගල ,ගාල්ල හා මාතර යන ශාඛාවන්හි සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක කාලපරිච්ඡේදය තුලදී පවත්වන ලද පාඨමාලා හා සහභාගිවූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොළඹ ප්‍රධාන කාර්යාලයෙහි 2010 වර්ෂයේ පාඨමාලා 142 ක්‍රියාත්මකව පැවති අතර එය 2012 වර්ෂය වන විට 150 දක්වා වැඩිකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ප්‍රමාණය 143 දක්වා අඩු වී තිබුණි . මෙම පාඨමාලා සඳහා සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව 2011 වර්ෂයේ දී 8,139 දක්වා වර්ධනය වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී එය 6,011 දක්වා අඩු වී තිබුණි.

(ii) මහනුවර ශාඛාවේ 2010 වර්ෂයේදී සිසුන් 781 ක සහභාගිත්වයෙන් පාඨමාලා 23 පවත්වා තිබූ අතර එය ක්‍රමිකව වර්ධනය කර ගනිමින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පාඨමාලා සංඛ්‍යාව 44 ක් හා ශිෂ්‍ය සංඛ්‍යාව 1,428 දක්වා වැඩිකර ගැනීමේ හැකියාව තිබුණි. කෙසේ වුවද කුරුණෑගල ශාඛාවේ 2010 වර්ෂයේ පාඨමාලා 48 ක් පවත්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබූ පාඨමාලා සංඛ්‍යාව 41 ක් විය. සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව ද ඒ අනුව අඩුවී තිබුණි.

(iii) ගාල්ල ශාඛාවේ 2010 වර්ෂයේ පවත්වා තිබූ පාඨමාලා සංඛ්‍යාව 31 වූ අතර එය 2013 වර්ෂය වනවිට 38 දක්වා වර්ධනය කර ගැනීමත් ඒ අනුව ශිෂ්‍ය සංඛ්‍යාව. වැඩිකර ගැනීමටත් හැකි වී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී මාතර නව ශාඛාව විවෘත කිරීම හේතුවෙන් එහි පාඨමාලා 08 ආරම්භ කර තිබූ අතර

ගාල්ලේ පාඨමාලා සංඛ්‍යාව 33 ක් විය. ගාල්ල සහ මාතර සමස්ථයක් ලෙස සැලකීමේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ සියයට 12 ක පිරිහීමක් පැවතුණි.

(ii) සමස්ථයක් ලෙස සලකා බලන විට 2011 වර්ෂයේදී පාඨමාලා 236 ක් සඳහා ශිෂ්‍යයින් 11,423 ක් සහභාගිවී තිබුණද 2014 වර්ෂයේදී සංඛ්‍යාව 269 දක්වා වැඩිවී තිබූ නමුත් එයට සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව 9,775 දක්වා අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද වැඩමුළු හා කෙටිකාලීන පාඨමාලා සංඛ්‍යාව අඩුවීම මීට හේතු වී ඇති බව සභාපතිවරයා විසින් දන්වා ඇත.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ඇතුළත් වී, පාඨමාලා හැරගිය ශිෂ්‍යයින් සංඛ්‍යාව 400 ක් වී තිබුණි. ශිෂ්‍යයින් පාඨමාලාව හැර යාමට හේතු වූ කරුණු පිළිබඳ පරීක්ෂා කර ඊට පිළියම් යොදා නව පාඨමාලාවක් හඳුන්වාදී බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කර ගැනීමක් හා සැලසුම් සහගතව පාඨමාලා ක්‍රියාත්මක කිරීමට ආයතනයේ අවධානය යොමුවී නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 ඔක්තෝබර් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම, ප්‍රදානයක් වශයෙන් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයට පවරා දීමට අනුමැතිය ලබාදී තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමේ නීත්‍යානුකූල හිමිකම ආයතනයට පවරාගෙන නොතිබුණි.

(ආ) 2007 නොවැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආයතනයට පවරා දීමට තීරණය කළ ගාල්ල නගරයෙහි පිහිටි ඉඩමක 2010 මාර්තු 31 දිනට රු.302,707,070 ක් වැය කර අධ්‍යාපන මධ්‍යස්ථානයක් ඉදිකර ඇතත් එම ඉඩමේ නීත්‍යානුකූල හිමිකම 2015 දෙසැම්බර් 31 දින දක්වාම ආයතනයට පවරාගෙන නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் நாயகம் அலுவலகம்
Auditor General's Department

4.3 නිෂ්ක්‍රීය වත්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 9,140,508 ක් වූ ලිපිද්‍රව්‍ය තොගය තුල රු.327,324 ක් වූ ලිපිද්‍රව්‍ය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

4.4 ආර්ථික නොවූ ගණුදෙනු

2012 පෙබරවාරි 03 දින නිකුත් කර ඇති පත්වීම් ලිපියකට අනුව සම්බන්ධීකාරක නිලධාරී තනතුරකට 2012 පෙබරවාරි 08 දින සිට බලපාන පරිදි මාස 06 ක කාලයකට මාසිකව රු.30,000 ක මුදලක් ගෙවීමේ පදනම මත නිලධාරියෙකු පත්කර තිබුණි. 2014 දෙසැම්බර් 12 දින දක්වා ඔහුගේ සේවා කාලය දීර්ඝ කර ගනිමින් වර්ෂ 2 මාස 11 ක පමණ වූ කාලයක් සේවය කර තිබුණද එම කාලපරිච්ඡේදය තුල ඔහුගේ පැමිණීම හා පිටවීම පිළිබඳ සටහන් තබා නොතිබුණු අතර ඉටුකළ කාර්යයන් පිළිබඳ තොරතුරු ලබා නොගෙන ආයතනය විසින් එම නිලධාරියාට අදාල කාල පරිච්ඡේදය තුල රු.1,050,000 ක් ගෙවීම් කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පිරිඩි 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2015 දෙසැම්බර් 10 දින දිය.

5.2 සංයුක්ත සැලැස්ම

2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම අනුව,ශුද්ධ ලාභයේ වර්ධනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව වාර්ෂිකව සියයට 20 කින් වැඩිවීම අපේක්ෂා කළද සමාලෝචිත වර්ෂයේ ලාභයේ පිරිහීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට15.7 ක් විය.

ගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

5.3 අයවැය ලේඛනමය පාලනය

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම හා වියදම සත්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී මෙහෙයුම් ආදායම රු.මිලියන 25.67 කින් හෙවත් සියයට 3 කින් අඩුවීමක් නිරීක්ෂණය වූ අතර සංවර්ධන වියදම් සියයට 176 කින්ද, පරිත්‍යාග සියයට 140 කින්ද, ප්‍රසාද දීමනා සියයට 83 කින්ද වශයෙන් වාර්ෂික ඇස්තමේන්තුගත වියදම ඉක්මවා වියදම් කර තිබීමෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) පාඨමාලා පැවැත්වීම

(ආ) වත්කම් කළමනාකරණය

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
2014 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර
සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ

හැඳින්වීම

මෙම ප්‍රකාශනය තුළ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය හා වන විස්තරාත්මක ප්‍රතිපත්ති ප්‍රකාශනයක් අඩංගු වේ. ආයතනයේ ව්‍යවහාර මුදල් වනුයේ ශ්‍රී ලංකා රුපියල් ය (LKR).

ආදර්ශ මූල්‍ය ප්‍රකාශනයන් සමස්තය පහත ඒවාගෙන් සමන්විත වේ.

ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ඒකාබද්ධ අදාළ වන ගිණුම්කරන ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2014 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

පටුන

පිටු අංකය

ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ඒකාබද්ද විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
(ශ්‍රිතිය වියදම් මගින් විශ්ලේෂණය කළ ආයතන ප්‍රකාශන එළඹුම)

ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන සැකසෙන ඒකාබද්ධ සටහන්

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය

	'31 දෙසැම්බර්		'31 දෙසැම්බර්	
සටහන්	NIBM 2014	ඒකාබද්ධ 2014	NIBM 2013	ඒකාබද්ධ 2013
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, ඇංගන හා උපකරණ 4	898,406,654	4,383,978,458	901,910,816	2,729,804,842
අස්පෘශ්‍ය වත්කම් 5	1,107,951	5,013,616	1,809,369	5,412,225
අනුබද්ධ ආයතනවල ආයෝජනය 6	550,000,010		450,000,010	
වෙනත් ජංගම නොවන වත්කම්	10,573,795	10,573,795	9,430,828	9,430,828
	1,460,088,410	**4,399,565,869**	**1,363,151,023**	**2,744,647,895**
ආරක්ෂිත තැන්පත්	**900,000.00**	**900,000.00**	**900,000.00**	**900,000.00**
ජංගම වත්කම්				
බඩු වට්ටෝරු 7	9,194,901	15,630,123	6,852,694	10,414,307
කල් පිරෙන දිනට පැවති මූල්‍ය වත්කම් 8	229,999,915	1,179,443,577	203,000,000	882,283,722
වෙළෙඳාම් සහ අනෙකුත් ලැබීම් 9	107,508,275	195,994,068	102,229,630	157,086,858
අනෙකුත් මූල්‍ය නොවන වත්කම්	2,231,210	2,231,210	2,091,623	2,091,623
මුදල් හා බැංකු සේවා 10	41,010,414	ww50,243,912	29,252,108	39,748,944
	389,944,715	**1,443,542,890**	**343,426,055**	**1,091,625,454**
මුළු වත්කම්	**1,850,933,125**	**5,844,008,759**	**1,707,477,078**	**3,837,173,349**
අරමුදල් සහ බැරකම්				
ප්‍රදාන				
රජයේ ප්‍රදාන 11	**57,175,766**	**57,175,766**	**57,175,766**	**57,175,766**
ප්‍රාග්ධන හා සංචිත				
ප්‍රකාශිත ප්‍රාග්ධනය				
ප්‍රත්‍යගණන සංචිත 12	151,238,166	151,238,166	151,706,814	151,706,814
රඳවාගත් ඉපැයුම් 13	792,321,994	1,311,052,373	819,628,145	1,183,972,396
	943,560,160	**1,462,290,539**	**971,334,959**	**1,335,679,210**
වෙනත් ආධාර 14	1,068,000	1,068,000	1,068,000	1,068,000
ප්‍රාග්ධන ආධාර 15	369,776,287	369,776,287	378,067,767	378,067,767
	370,844,287	**370,844,287**	**379,135,767**	**379,135,767**
ජංගම නොවන බැරකම්				
පුස්තකාල තැන්පතු	2,481,000	4,395,000	2,624,000	4,335,000
බැංකු ණය		2,856,457,001		1,417,524,425
විලම්භිත බදු බැරකම් 16	18,229,430	18,229,430	14,901,974	16,349,461
විශ්‍රාම ප්‍රතිලාභ බැරකම් 17	18,713,426	19,393,435	17,022,963	17,462,742
ජංගම නොවන බැරකම්				
	39,423,856	**2,898,474,866**	**34,548,937**	**1,455,671,628**
ජංගම බැරකම්				
පුස්තකාල තැන්පතු	663,000	1,533,000	987,000	1,191,000
වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු 18	264,622,440	867,987,811	246,360,519	581,568,875
ජංගම බදු බැරකම් 19	173,183,616	184,242,490	17,000,000	25,816,973
ප්‍රතිපාදන 20	1,460,000	1,460,000	934,130	934,130
	439,929,056	**1,055,223,301**	**265,281,649**	**609,510,978**
මුළු අරමුදල් හා බැරකම්	**1,850,933,125**	**5,844,008,759**	**1,707,477,078**	**3,837,173,349**

මෙම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල පිටු අංක 10 සිට 25 සහ සටහන් අංක 28 සිට 38 හි සම්පූර්ණ විස්තර ඇතුළත්ය.
මෙම මූල්‍ය ප්‍රකාශනවල පිළියෙල කිරීමේ සහ ඉදිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම සහ අත්සන් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සිදුකරන ලදී

සුසන්ත ප්‍රනාන්දු	**ආචාර්ය ඊ.ඒ. වීරසිංහ**	**ජී.ඩී. බර්නාඩ්**
සභාපති	**අධ්‍යක්ෂ ජනරාල්**	**අධ්‍යක්ෂ මූල්‍ය**

		දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ		දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ	
		NIBM 2014	**ඒකාබද්ධ 2014**	**NIBM 2013**	**ඒකාබද්ධ 2013**
ආදායම	21	685,446,170	1,468,094,422	667,072,082	1,249,443,356
විකුණුම් පිරිවැය	22	230,778,668	741,479,689	195,637,128	503,399,043
දළ ලාභය		**454,667,502**	**726,614,733**	**471,434,954**	**746,044,313**
වෙනත් ආදායම්	23	40,558,614	97,119,994	40,375,100	100,814,376
බෙදාහැරීමේ පිරිවැය					
පරිපාලන වියදම්	24	249,587,880	400,832,841	225,428,613	340,647,519
වෙනත් වියදම්	25	5,799,508	9,770,708	2,015,864	2,859,117
මෙහෙයුම් ලාභය		**239,838,728**	**413,131,178**	**284,365,577**	**503,352,053**
මූල්‍ය පිරිවැය	26	1,584,478	4,801,792	1,376,232	4,160,793
මූල්‍ය ආදායම		1,771,847	1,771,847	1,763,397	1,763,397
ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය		**240,026,097**	**410,101,233**	**284,752,742**	**500,954,657**
ආදායම් බදු වියදම්	27	(26,897,147)	(42,769,496)	(34,587,953)	(47,276,376)
බෙදාහැරිය හැකි ලාභයෙන් 25% ක්					
ආදායම් බදු වගකීම		(53,696,388)	(53,696,388)		
ආදායම් බදුවලට පසු ශුද්ධ ලාභය		**159,432,562**	**313,635,349**	**250,164,789**	**453,678,281**
වෙනත් විස්තීර්ණ ආදායම්					
පසු සේවා නියුක්තිය මත ඇති වූ පාඩු					
ප්‍රතිලාභ බැඳීම්		121,589	(207,395)	(415,365)	
ඉවත් කරන වත්කම් නැවත අගය කිරීම		468,648	468,648	342,059	342,059
විනිමය වෙනස්වීම		32,995			
විනිමය ප්‍රතිලාභ පාඩු		95,797	(73,424)		
තනතුරු මත ඇති වූ ආයුගණක බදු බලපෑම					
සේවක ප්‍රතිලාභ බලපෑම		(1,187,419)	(1,221,464)	58,232	
වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම		**158,713,791**	**313,099,919**	**250,299,453**	**453,622,778**

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	අනෙකුත් සංචිත	රඳවාගත් ඉපැයුම්	පූර්ව වසර ගැළපුම්	NIBM	ඒකාබද්ධ
2013 ජනවාරි 01 දිනට වන වසර සඳහා ලාභය		569,328,692		569,328,692	730,349,618
ඉවත් කළ වත්කම් සඳහා ප්‍රත්‍යාගණන වටිනාකම ආයෝජන මත පොලිය		250,299,453		250,299,453	453,622,778
2013 දෙසැම්බර් 31 දිනට		819,628,145		819,628,145	1,183,972,396
2014 ජනවාරි 1 දිනට වර්ෂයේ ලාභය		819,628,145		819,628,145	1,183,972,396
ආදායම් බදු සඳහා වැඩිපුර ගෙවීම 2012/13			217,384	217,384	217,384
ක්ෂය සඳහා වැඩිපුර වෙන්කරීම්			180,069	180,069	180,069
ආදායම් බදු වගකීම සඳහා ලාභයෙන් 25% ක් බෙදාහැරීම			(186,417,395)	(186,417,395)	(186,417,395)
2014 දෙසැම්බර් 31 දිනට		819,628,145		633,608,203	997,952,454
වසර තුළ ලාභය		158,713,791		158,713,791	313,099,919
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම					
2014 දෙසැම්බර් 31 දිනට		978,341,936	(186,019,942)	792,321,994	1,311,052,373

	NIBM 2014	ඒකාබද්ධ 2014	NIBM 2013	ඒකාබද්ධ 2013
මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ				
වසර සඳහා අතිරික්තය බදු පෙර	240,026,097	**410,101,233**	284,752,742	500,954,657
අරමුදල් සංචලනය හා සම්බන්ධ නොවන අයිතමන් සඳහා ගැළපුම්				
ක්ෂය වීම්	75,571,980	119,392,629	59,474,939	85,441,745
ස්ථාවර වත්කම් විකුණුමෙන් ශුද්ධ (ලාභය)/අලාභය	(1,974,101)	(1,945,981)	2,838,243	2,838,243
පසු සේවා නියුක්තිය මත ඇති වූ පාඩු	1,279,779	1,641,596	1,231,233	1,023,263
ක්‍රමක්ෂය	(1,282,554)	(1,282,554)	(845,725)	(845,725)
විලම්බිත ආදායම්	(8,291,481)	(8,291,481)	(8,291,481)	(8,291,481)
ආයෝජනය මත පොලී	(16,568,056)	(78,398,821)	(22,184,310)	(85,704,992)
භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම්				
ලාභාංශ ආදායම්	(5,500,000)		(3,500,000)	
විනිමය වෙනස්වීම්				32,995
විනිමය ඉපයීම්/ පාඩු		95,797		(73,424)
				(788,459)
	283,261,663	441,312,417	313,475,641	494,586,822
පාරිතෝෂික ගෙවීම්	(776,736)	(776,736)	(326,300)	(326,300)
ආදායම් බදු ගෙවීම්	(107,282,473)	(122,394,452)	(36,532,581)	(43,229,424)
කාරක ප්‍රාග්ධන අයිතම වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	175,202,454	318,141,229	276,616,760	451,031,098
පුස්තකාල තැන්පතුවල (අඩුවීම්)/වැඩිවීම්	(467,000)	402,000	(946,000)	174,000
	174,735,454	318,543,229	275,670,760	451,205,098
කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම්				
බඩු වට්ටෝරුවල අඩුවීම්/(වැඩිවීම්)	(2,342,207)	(5,215,816)	2,113,862	1,174,047
වෙළෙඳ හා වෙනත් ලැබීම් අඩුවීම්/(වැඩිවීම්)	(5,278,645)	(38,526,208)	(11,721,610)	(28,008,722)
වෙළෙඳ හා වෙනත් ගෙවීම් (අඩුවීම්)/වැඩිවීම්	18,261,922	286,037,937	38,474,810	190,357,274
ප්‍රතිපාදනයන්ගේ (අඩුවීම්)/වැඩිවීම්	525,870	525,870	34,130	34,130
	185,902,394	561,365,012	304,571,952	614,761,827
ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ				
ආයෝජන මත ලැබුණු පොලී	16,568,056	78,398,821	22,184,310	85,704,992
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	(71,317,338)	(86,344,216)	(126,547,031)	(235,854,060
ආයෝජනය NSBM	(100,000,000)		(100,000,000)	
ආයෝජන WIP		(1,686,802,479)		(1,471,873,375)
ස්ථාවර වත්කම් අළෙවි කිරීම	2,105,109	2,105,109	473,529	473,529
ලාභාංශ	5,500,000		3,500,000	
	38,758,221	(1,131,277,753)	104,182,760	(1,006,787,087)
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ				
ණය ලබාගැනීම්		1,438,932,576		1,417,524,425
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන 1)	**232,252,108**	**922,032,666**	**128,069,348**	**511,295,328**
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන 2)	**271,010,329**	**1,229,687,489**	**232,252,108**	**922,032,666**
සටහන 1				
බැංකු ශේෂය	28,733,408	39,061,244	11,826,648	42,781,128
අත ඇති මුදල්	518,700	687,700	1,242,700	3,514,200
කෙටිකාලීන තැන්පතු	203,000,000	882,283,722	115,000,000	465,000,000
	232,252,108	**922,032,666**	**128,069,348**	**511,295,328**
සටහන 2				
බැංකු ශේෂය	40,605,914	49,399,193	28,733,408	39,061,244
අත ඇති මුදල්	404,500	844,719	518,700	687,700
කෙටිකාලීන තැන්පතු	229,999,915	1,179,443,577	203,000,000	882,283,722
	271,010,329	**1,229,687,489**	**232,252,108**	**922,032,666**

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය
මූල්‍ය ප්‍රකාශ සඳහා වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 සංයුක්ත විස්තරය

1.1 නෛතික හා නිත්‍ය ආකෘතිය

1991 අංක 21 දරන සංශෝධන පනතින් සංශෝධිත 1976 අංක 23 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ස්ථාපිත කරන ලදී. එය පිහිටා ඇත්තේ අංක 120/5, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයෙහි ය.

1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය.

වසර පුරා ආයාතනයේ කාර්යයන් පහත පරිදි වේ.

ගුණාත්මක ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයේ හා ආශ්‍රිත ක්ෂේත්‍රයන් සඳහා උපදෙස් සැපයීම.

සංවිධානවල කළමනාකරුවන් හා අධීක්ෂණ කාර්යමණ්ඩල නිපුණතා සංවර්ධනය

සංවිධානවල සේවකයන් පුහුණු කිරීම හා ඔවුන්ට අධ්‍යාපනය ලබාදීම.

සංවිධානවල ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැපයීම.

කළමනාකරණ උපදේශන හා උපදේශක සේවාවන් සැපයීම.

1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම.

මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකියනු ලබන්නේ පාලක සභාවයි. මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධව පාලක සභාවේ වගකීම, 'පාලක සභාවේ වගකීම් ප්‍රකාශය' තුළ දැක්වේ.

2. අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලාංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLFRS/LKAS)අනුව මූල්‍ය ප්‍රකාශන සකසා ඇත.

2011 දෙසැම්බර් 31 වන දා තෙක් ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLAS) වලට අනුකූලව, 2011 දෙසැම්බර් 31 අවසන් වූ වසර තෙක්, එම වසර ද ඇතුළත්ව, වන කාලසීමාව සඳහා මූල්‍ය ප්‍රකාශනයන් ආයතනය මගින් සකසන ලදී.

2.1.2 ඇගයීමේ පදනම

වෙළෙඳපොළ වටිනාකම මත සමහර වත්කම් හා බැරකම් හැර මූලය ප්‍රකාශන සකසනු ලැබ තිබෙන්නේ ඓතිහාසික පිරිවැය පදනම මතයි.

2.1.3 ව්‍යවහාර මුදල් හා ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශනවල ඇති අයිතමයන් මැන ඇත්තේ ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ ඇති මුදල්වලිනි. (ව්‍යවහාර මුදල්) මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇත්තේ ආයතනයේ ව්‍යවහාර හා ඉදිරිපත්කිරීමේ මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලිනි.

2.1.4 අනුකූලතා ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් ('මූල්‍ය ප්‍රකාශන') යනාදිය සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය මගින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS හා SLFRS)වලට අනුකූලව ය.

2.1.5 ප්‍රවර්තන ව්‍යාපාරය

පාලක සභාවේ සාමාජිකයන්, ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස පැවතීමට ආයතනයේ හා එහි ඇති හැකියාව කක්සේරු කර ඇති අතර එහි වාණිජ කටයුතු ඈවර කිරීමට හෝ නැවැත්වීමට අදහස් නොකරයි.

2.1.6 සන්සන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ආයතනය මගින් සමානුයෝගීව භාවිතා කරන අතර පෙර වසර සමඟ ද අනුකූල වේ. වත්මන් වසරේ ඉදිරිපත්කිරීම/වර්ගීකරණය හා අනුගත වීම පිණිස පෙර වසරේ සංඛ්‍යා හා ස්ථානවල අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකර ඇත.

2.1.7 ද්‍රව්‍යාත්මක හා සමාහාර බව

සමාන අයිතමයන්ගේ ද්‍රව්‍යාත්මක වර්ග වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර ඇත. ද්‍රව්‍යාත්මක නොවන ද්‍රව්‍ය නොවන්නේ නම් එකිනෙකට වෙනස් අයිතමයන් වෙනමම දක්වා ඇත.

2.1.8 අදාළ වන ගිණුම් විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන

> මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී, ආදායම් වියදම් සම්පත් හා බැරකම්වල වාර්තාගත ප්‍රමාණයට බලපාන හා වාර්තා කරන දිනය වන විට ඇති අනිශ්චිත බැරකම් අනාවරණය සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යනාදිය ඇති කර ගැනීමට කළමනාකාරිත්වයට සිදුවේ.
>
> මීළඟ මූල්‍ය වර්ෂයේ වත්කම් හා බැරකම් ප්‍රමාණවලට ද්‍රව්‍යාත්මක ගැලපුම් සිදුකිරීමේ අවදානමක් ඇති කරන මූල්‍ය තත්ත්ව දිනයට අදාළ ඇස්තමේන්තු අනිශ්චිතතාවයන්ගේ ප්‍රධාන මූලාශ්‍ර සහ අනාගතයට බලපාන ප්‍රධාන උපකල්පනයන් අවධානයට ගැනිණි.

2.2 වත්කම් තක්සේරු කිරීමේ පදනම

2.2.1 දේපළ, පිරියත හා උපකරණ

(අ) ඇගයීම

> දේපළ, පිරියත හා උපකරණයන්හි සියලු අයිතමයන් මූලිකව පිරිවැය මත වාර්තා කර ඇත. දේපළ පිරියත හා උපකරණයන්හි අයිතමයන් ප්‍රත්‍යාගණනය කර ඇති විටක, එම වත්කම්වල සමස්ත වර්ගයට ප්‍රත්‍යාගණනය කරනු ලැබ ඇත. එදිනෙදා සේවා, සමුච්ඡගත ක්ෂයවීම් අවමය හා සමුච්චගත හානිකරන සඳහා පිරිවැය හැරුණුකොට දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත ප්‍රකාශ කොට ඇත.
>
> වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට ඉදිරියට රැගෙන යන ප්‍රමාණයේ ඕනෑම වැඩිවීමක්, එය නැවත වියදමක් නොවන්නේ නම්, සෘජුවම ප්‍රත්‍යාගණිත අතිරික්තය වෙත බැර කෙරේ. එවන් තත්ත්වයක් යටතේ දී පෙර ලියා තබන ලද වටිනාකමෙහි තරමට එම වැඩිවීම ආදායමක් ලෙස ගණන් ගැනේ. කිසියම් වත්කමක ඉදිරියට ගෙන ආ වටිනාකම ප්‍රත්‍යාග ණනයක් හේතුවෙන් අඩු කරනු ලබන්නේ නම් එම අඩු කිරීම වත්කමට අදාළව පැවති පූර්ව වැඩිකිරීමක් ප්‍රතිවර්තනය නොවන්නේ නම් එවිට අදාළ අඩුකිරීම වියදමක් සේ හඳුනා ගැනේ. එවන් අවස්ථාවක දී එකී වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි රඳවා ගනු

ලබන වටිනාකම ඉක්මවා අඩු කිරීම නොයන දුරට ප්‍රත්‍යාගණන අතිරික්තය අය කෙරේ. වත්කමක් සම්බන්ධයෙන් වන ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි පවත්නා ශේෂයන් සෘජුවම වත්කම් අපහරණය හෝ අවභාවිතය මත සමුච්චිත ලාභ හෝ අලාභයට සෘජුවම මාරු කෙරේ.

(ආ) දේපළ, පිරියත හා උපකරණයන්හි ඵලදායී ජීවිත කාලයන්

වත්කම්වල සුන්බුන් අගයන්, එක් එක් වාර්තා කෙරෙන දිනයන් වන විට වත්කම්වල ඵලදායී ජීවිත කාලයන් හා ක්ෂයවීම් ක්‍රමයන්; මෙම අගයන් ඇස්තමේන්තු කිරීමේ දී වෘත්තීයමය නිපුණතාවය මත පදනම්ව කළමනාකරණය ගනු ලැබූ විනිශ්චයන්, අනුපාත හා ක්‍රමවේදයන් යනාදිය ආයතනය මගින් විග්‍රහ කෙරේ.

(ඇ) ක්ෂය වීම

වත්කම මත රඳා පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව විදහා දක්වෙන බැවින් දේපළ, පිරියත හා උපකරණයන්හි එක් එක් අයිතමයන්ගේ ඵලදායී ජීවිත කාලය මත තබමින් ලාභ අලාභ ක්ෂය වීම් හඳුනාගෙන ඇත.

සින්නක්කර ඉඩම් ක්ෂය නොවේ
ආර්ථිකමය ඵලදායී ජීවිත කාලයන් පහත පරිදි ය.

අස්පෘශ්‍ය වත්කම්	33 ⅓%
ගොඩනැගිලි ඉදිකිරීම්	2%
නවීකරණය	10%
සීලිං පංකා	25%
ගිනි නිවන	20%
ගෘහභාණ්ඩ හා උපකරණ	20%
කාර්යාලීය උපකරණ	20%
පරිගණක උපකරණ	25%
මෝටර් වාහන	25%
පුස්තකාල පොත්	20%

භාවිතා කිරීම සඳහා වත්කම් ලබාගත හැකි විට ක්ෂයවීම ඇරඹෙන අතර විකිණීම සඳහා තබා ඇති බවට වර්ගීකරණය කෙරෙන දිනයේ දී හා වත්කම ඉවත් කිරීම සඳහා නැවත හඳුනා ගැනෙන දිනයේ දී ක්ෂයවීම අවසන් වේ.

(ඈ) ප්‍රතිසම්පාදන පිරිවැය

දේපළ පිරිසක හා උපකරණයන්ගේ මුල්වරට හඳුනාගන්නා ලද අනාගත ආර්ථිකමය ප්‍රතිලාභ ප්‍රමිතිය පවත්වාගෙන යාමට හෝ එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය වන වියදම, වියදමක් ලෙස හඳුනා ගැනේ.

(ඉ) ඉවත් කිරීම සඳහා නැවත හඳුනාගැනීම

දේපළ, පිරියත හා උපකරණයන්හි අයිතිමයක් ඉවත් කිරීම සඳහා හඳුනා ගැනෙන්නේ අපහරණය කිරීමේ දී හෝ එය භාවිතයෙන් හෝ අපහරණයෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන විටදී ය. යම් වත්කමක් ඉවත් කිරීම සඳහා හඳුනා ගැනීම තුළින් පැන නගින ලාභයක් හෝ අලාභයක් වත්කමේ ශුද්ධ අපහරණ අගය හා රැගෙන යනු ලබන අගය අතර වෙනස ලෙස ගණනය කිරීමෙන්) වත්කම ඉවත් කිරීම සඳහා හඳුනා ගන්නා වසරේ පර්යාප්ත ආදායම් ප්‍රකාශනය තුළට එක් කරනු ලැබේ.

2.2.2 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වත්කම පළමු වරට උපයෝජනය කරන අවස්ථාවේ දී කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුම් වෙතට මාරු කෙරේ.

2.2.3 අස්පෘෂ්‍ය වත්කම්

(අ) හඳුනාගැනීමේ පදනම

අස්පශ්‍ය වත්කමක් යනු භෞතික පැවැත්මක් නොමැති හඳුනාගත හැකි අමූල්‍ය වත්කමකි. හඳුනාගත හැකි බව පැන නැඟෙන්නේ අදාළ වත්කම තවත් කළ හැකි හෝ කොන්ත්‍රාත් හෝ අනෙකුත් නෛතික හිමිකම් වෙතින් පැන නැගෙන විට ය.

අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගත හැක්කේ වත්කමට ආරෝපණය වන අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලායාමේ විභව්‍යතාවක් තිබෙන්නේ නම් පමණි. එසේම වත්කමේ පිරිවැය විශ්වාසී අයුරින් මිනිය හැක්කේ අස්පෘෂ්‍ය වත්කම් පිළිබඳ KLAS 38 අනුව ය. ආයතනයෙහි අස්පෘෂ්‍ය වත්කම්වලට ඇතුළත් වනුයේ පරිගණක දෘඩාංගයන්හි සමස්ත කොටසක් නොවන ආයතනය විසින් භාවිතය සඳහා අවසරලත් පිරිවැයක් සහිත පරිගණක මෘදුකාංගයන් ය.

(ආ) ගිණුම් පදනම

වෙන් වෙන් වහයෙන් අත්පත් කරගන්නා අස්පෘෂ්‍ය වත්කම්හි වටිනාකම් මනිනු ලබන්නේ හඳුනා ගන්නා ලබන ආරම්භක පිරිවැයට ය.

ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ පිරිවැයට සහ සමුච්චිත හානිකරණ පාඩුවක් තිබෙන්නේ නම් ඒ අනුව ඉදිරියට ගෙන යනු ලැබේ.

(ඇ) ක්‍රමක්ෂය

නිශ්චිත භාවිත කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් සඵල ආර්ථික ජීව කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

ක්‍රමක්සය ක්‍රමවේදයක් සඵල ජීව කාලයක් සහ වටිනාකම් අවම වශයෙන් සෑම වාර්තා කරන දිනයකදීම සමාලෝචනය කෙරේ.

2.2.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය.

සෑම වර්ගීකරණ දිනයකදීම කිසියම් වත්කමකට හානිකරණයන් පිළිබඳ කිසියම් ලක්ෂණයක් තිබේ දැයි ආයතනය තන්සේරු කරයි. එවන් කිසියම් ලක්ෂණයක් තිබේ නම් හෝ කිසියම් වත්කමකට වාර්ෂික හාකිකරණ පරීක්ෂාවක් අවශ්‍ය නම් ආයතනය වත්කමහි යළි අය කර ගත හැකි ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවක් සකසයි. වත්කමක යළි අයකර ගත හැකි වටිනාකම යනු වත්කමේ උපරිම අගය හෝ වෙළෙඳ ඒකකයෙහි ශුද්ධ වටිනාකම එක් එක් වත්කමෙහි වටිනාකම මත තීරණය කරන අතර එසේ නොවන විටෙක දී සමූහයේ වත්කම් හෝ අනෙකුත් වත්කම් මත ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ගලා ඒමේ ස්වරූපයක් නොතිබිය යුතු ය. වත්කමක ඉදිරියට ගෙන ආ වටිනාකම යළි අයකර ගත හැකි වටිනාකම ඉක්මවන්නේ නම් වත්කම හානිකරණ වූවා සේ සැලකෙන අතර එය යළි අයකර ගත හැකි වටිනාකමට සටහන් කෙරේ. සඵල වටිනාකම තක්සේරු කිරීමේ දී වත්කමෙහි අවදානම් විශේෂතා සහ මුදලේ කාලීන වටිනාකම නිරූපණය කෙරෙන වර්තමාන වෙළෙඳපොළ තක්සේරුව පිලිබිඹු වන පෙරබදු වට්ටම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත ගනාගත මුදල් ප්‍රවාහයන් එහි වර්තමාන වටිනාකමට වට්ටම් කෙරේ.

අඛණ්ඩව මෙහෙයුම්හි හානිකරණ පාඩු ප්‍රත්‍යාගණනය ව්‍යාපාර වස්තුවට ගනු ලබනා අවස්ථාවේ පූර්වයෙන් ප්‍රත්‍යාගණිත දේපළ හැර හානිකරණ වත්කම් ක්‍රියාකාරිත්වයට අනුගත වන වියදම් වර්ගකීකරණයන් තුළ විස්තීර්න ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙහිදී හානිකරණය ද ව්‍යාපාර වස්තුව තුළ හඳුනාගනු ලබන්නේ කවර හෝ පෙර ප්‍රත්‍යාගනන අගයක් දක්වා ය.

කීර්තිනාමය හැර අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් පෙර හඳුනාගනු ලැබූ හානිකරණ පාඩු තවදුරටත් නොපවතින්නේ ද හෝ අඩු වී ඇත්තේ ද යන්න පිළිබඳ කිසියම් සංඥාවක් වේ දැයි සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරුවක් කරනු ලැබේ. එවන් තත්ත්වයක් පවතී නම් ආයතනය යළි අය කරගතහැකි ප්‍රමානය පිළිබඳ ඇස්තමේන්තුවක් සකසයි.

පෙරදී හඳුනාගනු ලැබූ හානිකරණ පාඩුවක් වෙනස් කරනු ලබන්නේ අවසන්වරට හානිකරණ පාඩුවක් හඳුනාගත් දින පටන් වත්කම්හි යළි අයකර ගතහැකි වටිනාකම තීරණය කිරීම හා භාවිතා කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදුව ඇත්තේ නම් පමණි. තත්ත්වය එසේ වන්නේ නම් වත්කමේ ඉදිරියට ගෙන ආ වටිනාකම එහි යළි අය කරගත හැකි වටිනාකම දක්වා වැඩි කෙරේ. වත්කම සම්බන්ධයෙන් හානිකරණ පාඩුවක් හඳුනාගෙන නොමැත්තේ නම් වැඩකරන ලද ඉදිරියට ගෙන යන ලද වටිනාකම තීරණය කරනු ලබන්නේ වත්කම්හි ක්ෂය ශුද්ධ අගයත් හානිකරන පාඩු පූර්ව වර්ෂයත් සම්බන්ධයෙන් හඳුනාගැනීමෙන් පසුව ය. එවන් වෙනස් කිරීමක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

2.2.5 මූල්‍ය උපකරණ

2.2.5.1 මූල්‍ය වත්කම්

ආයතනය එහි මූල්‍ය වත්කම් පහත කාණ්ඩ යටතේ වර්ගීකරණය කරනු ලබයි: ණය හා ලැබීම්, කල් පිරෙන දිනට මූල්‍ය වත්කම් අත්කර ගැනීමේ අරමුණ මත වර්ගීකරණය පදනම් වේ. ආයතනය තම මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව මූලික හඳුනාගැනීමේ දී තීරණය කරනු ලබන අතර මෙම තෝරාග ැනීම සෑම වාර්තා කරන දිනයකදීම නැවත ඇගයීමක් සිදුකරයි.

ආයතනයේ මූල්‍ය වත්කම් සඳහා ස්ථිර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, මුදල් හා වෙළෙඳ හා අනෙක් ලැබීම් ද අයත් වේ.

2.2.5.1.1 මූලික හඳුනාගැනීම හා ඇගයීම.

ආයතනය එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳ මූලික හඳුනා ගැනීමේ දී තීරණය කරනු ලබයි. සියලුම මූල්‍ය වත්කම් මූලිකව හඳුනාගැනීමේ දී සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට අනුව හඳුනා ගැනේ.

ආයතනයේ මූල්‍ය වත්කම් සඳහා ස්ථිර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, මුදල් හා වෙළෙඳ හා අනෙක් ලැබීම් ද අයත් වේ.

2.2.5.1.2 පසු ඇගයීම්

මූල්‍ය වත්කම්වල පසු ඇගයීම පහත පරිදි එහි වර්ගීකරණය මත රඳා පවතී.

අ.) ණය හා ලැබීම්

ණය සහ ලැබීම් යනු සක්‍රීය වෙළෙඳපොළෙන් උපුටා නොදැක්වෙන ස්ථාවර හෝ තීරණය කළ නොහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ඇගයීම් ක පසුව එවන් මූල්‍ය වත්කම් හානිකරණ අඩුකළ සක්‍රිය පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැය පදනමට පසුව මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කරගැනීම මත වන කවර හෝ වට්ටමක් හෝ වාරිකයක් සහ සක්‍රිය පොලී අනුපාත ක්‍රමයේ කොටසක් වන පිරිවැය හෝ ගාස්තු සැලකිල්ලට ගනිමිනි. සක්‍රිය පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමෙහි ඇතුළත් ය. හානිකරණයෙන් පැන නැගෙනා පාඩු මූල්‍ය පිරිවැය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
මූල්‍ය ප්‍රකාශ සඳහා වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

වෙළෙඳපොළ පොලී අනුපාතයට අඩු අනුපාතයක් යටතේ දෙනු ලබන ණය අගයනු ලබන්නේ සමාන නිෂ්පාදනයන්හි වෙළෙඳපොළ අනුපාත මත පදනම්ව ගණනය කෙරෙන සාධාරණ වටිනාකම මත ය.

අනුබද්ධ සමාගම ඔවුන්ගේ ණය වෙළෙඳපොළ වටිනාකම මත අගය කර නැත.

ලැබිය යුතු ණය වෙළඳ සහ අනෙකුත් ණයගැතියන්ගෙන් සමන්විත වේ.

ආ) කල් පිරෙන දිනට ආයෝජන

ස්ථාවර සහ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල් පිරවුම් ඒවා කල්පිරෙන දින දක්වා පවත්වා ගැනීමට ආයතනයට අභිලාෂයක් මෙන්ම හැකියාවක් ද තිබූ අවස්ථාවේ ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සේ වර්ග කෙරේ.

කල් පිරෙන දිනට ආයෝජන සඳහා ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජන අයත් වේ.

2.2.5.1.3 ඉවත් කිරීම සඳහා නැවත හඳුනාගැනීම

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක් හෝ අදාළ වන පරිදි) ඉවත් කිරීම සඳහා නැවත හඳුනාගනු ලබන්නේ පහත සඳහන් අවස්ථාවල දී ය.

වත්කම්වලින් මූල්‍ය ප්‍රවාහ ලබාගැනීම සඳහා ඇති හිමිකම කල්පිනූ විට,

ආයතනය වත්කමෙන් මූල්‍ය ප්‍රවාහ ලබාගැනීමට ඇති අයිතිය මාරු කළ විට හෝ විධිවිධාන සම්පූර්ණ කිරීමේ වැඩපිලිවෙලක් යටතේ තෙවන පාර්ශ්වයකට භෞතික පටාවකින් තොරව ලැබුණු මූල්‍ය ප්‍රවාහය පූර්ණ වශයෙන් ගෙවීමට වගකීමක් වෙතැයි ආයතනය උපකල්පනය කරන විට සහ,

ආයතනය පසුව වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභයන් ප්‍රමාණවත් පරිද මාරු කර ඇතිවිටෙක, හෝ,

ආයතනය වත්කමෙහි සියලු ප්‍රතිලාභ හා අවදානම් ප්‍රමාණවත් පරිදි මාරුකර හෝ රඳවාගෙන නොමැති එහෙත් වත්කමේ පාලනයමාරු කර ඇති විටෙක.

ආයතනය වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කර හෝ විධිවිධාන සම්පූර්ණ කළ පසු ගෙවීමේ වැඩපිළිවෙලකට ඇතුළත් වී ඇතිවිටෙක සහ වත්කමෙහි සියලු අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි මාරුකර හෝ රඳවාගෙන හෝ නැති විටෙක සහ එහි පාලනය පවරා නැති විටෙක වත්කම හඳුනාගනු ලබන්නේ ආයතනය අඛණ්ඩව ඒ හා කටයුතු කරන තාක් දුරට ය.

මෙහිදී ආයතනය ආශ්‍රිත වගකිමක් ද හඳුනාගනී.

මාරුකරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම මනිනු ලබන්නේ ආයතනය විසින් රඳවාගනු ලබනා හිමිකම් සහ වගකීම් පිළිබිඹු වන්නා වූ පදනමක් මත ය.

මාරුකරන ලද වත්කමක් මත සුරක්ෂණයක ස්වරූපයෙන් වන්නා වූ අඛණ්ඩ මැදිහත්වීම වත්කමෙහි ඉදිරියට ගෙන එනු ලබන නියම වටිනාකම සහ නැමත ගෙවීමට ආයතනයට අවශ්‍ය වන්නා වූ ප්‍රතිලාභයේ උපරිම ප්‍රමාණයෙන් අඩු වටිනාකම මත අගය කෙරේ.

2.2.5.1.4 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණයට ලක්වන බවට විගස බද්ධ සාක්ෂි තිබේ දැයි සෑම වර්තාකරණ දිනයකම ආයතනය තක්සේරුවක් කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය කළ යුතු වන්නේ යයි සැලකෙනුයේ වත්කමෙහි මූලික හඳුනාගැනීමෙන් අනතුරුව හට ගන්නා වූ එක් හෝ සිදුවීම් ගණනාවක ප්‍රතිඵලයක් ලෙස හානිකරණය පිළිබඳ විෂය බද්ධ සාක්ෂි ඇත්තේ නම් (ඇති වූ පාඩු සිද්ධිය) විශ්වාසවන්ත ලෙස තක්සේරු කළ හැකි මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයෙහි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහයට පාඩු සිද්ධිය මගින් බලපෑමක් සිදුව ඇත්තේ නම් පමණි. හානිකරණ සාක්ෂිවල ණය ගැනියෝ හෝ ණයගැතියන් කාණ්ඩායමාක් සැලකිය යුතු මූල්‍ය අපහසුතා අත්විඳින බවට දර්ශකයක් පොලියේ හෝ මූලික ගෙවීමෙහි හිඟ හෝ පැහැර හැරීම් ඇති බවට සාක්ෂි ඇතුලත්විය යුතු අතර ඔවුන් බංකොලොත්භාවයට හෝ අනෙකුත් මූල්‍ය ප්‍රතිසංවිධානයන්ට ඇතුළ් විය හැකි බව පෙන්නුම් කළ යුතු අතර පැහැර හැරීම් සමඟ සම්බන්ධිත හිඟ හෝ ආර්ථික තත්ත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහයෙහි මිනිය හැකි පහත වැටීමක් පවතින්නේ යයි නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් විය යුතු ය.

මූල්‍ය ප්‍රකාශ සඳහා අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රමක්ෂ පිරිවැය මත ඉදිරියට ගෙන එන ලද මූල්‍ය වත්කම්.

ක්‍රමක්ෂ පිරිවැය මත ඉදිරියට ගෙන එන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ගත් කල ආයතනය පළමුව තක්සේරු කරනුයේ වෙන් වෙන් වශයෙන් වැදගත් වන්නා වූ මූල්‍ය වත්කම් සඳහා වෙන් වෙන් වශයෙන් පාඩු ගැළපීම පිළිබඳ විෂය බද්ධ සාක්ෂි පවතින්නේ ද එසේ නැතිනම් වෙන් වෙන් වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව පාඩු පිළිබඳ විෂය බද්ධ සාක්ෂි පවතින්නේ ද යන්න පිළිබඳවයි. වැදගත් වුව ද නොවූව ද වෙන් වෙන් වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් පාඩු ගැළපීම සම්බන්ධව විෂය බද්ධ සාක්ෂි නොපවතින්නේ යැයි ආයතනය තීරණය කරන්නේ නම් එවිට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට වත්කම ඇතුල් කරන අතර පාඩු ගැළපීමේ දී සාමූහිකව තක්සේරු කෙරේ. පාඩු ගැළපීමේ දී වෙන් වෙන්ව තක්සේරු කරන්නා වූ ද ගැලපුම් හානියක් හඳුනා ගනු ලබන්නා වූ වත්කම් ගැලපුම් කිරීමේ සාමූහික තක්සේරුවකට ඇතුල් නොකෙරේ.

පාඩු ගැලපුම් හානියක් පවතින්නේ යැයි විෂය බද්ධ සාක්ෂි පවතින්නේ නම් පාඩුවේ ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ වත්කම්හි ඉදිරියට ගෙන එන ලද ප්‍රමාණය හා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම යන දෙකෙහි වෙනස වශයෙනි. (අනාගතයේ අපේක්ෂිත එසේම සිදුවී නොමැති බැර අලාභයන් බැහැර කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම වට්ටම් කරනු ලබන්නේ මූල්‍ය වත්කමෙහි සැබෑ ඵලදායී පොලී අනුපාතය මත ය. කිසියම් ණයකට විචල්‍ය පොලී අනුපාතයක් පවතී නම් ගැලපුම් හානි ගණනය කිරීම සඳහා වන වට්ටම් අනුපාතය වනුයේ පවත්නා සපළදායී පොලී අනුපාතයයි. වත්කමේ ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම දීමනා ගිණුමක භාවිතය තුළින් අඩු කෙරේ. පාඩුවෙහි ප්‍රමාණය හඳුනා ගනු ලබන්නේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ය. පොලී ආදායම අඛණ්ඩව අවකරණිත ඉදිරියට ගෙන ආ වටිනාකම මත උපනචිත විය යුතු අතර ගැලපුම් හානි ගණනය කිරීම සඳහා වන අනාගත මුදල් ප්‍රවාහය වට්ටම් කිරීම සඳහා වන පොලී අනුපාතය භාවිතයෙන් උපචිත කෙරේ. පොලී ආදායම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කෙරේ. ආශ්‍රිත දීමනා සමඟ ණය අනාගතයේ අය කර ගැනීම සඳහා වන යථාර්ථවාදී අපේක්ෂාවක් නැති කල්හි සියලු ඒක පාර්ශ්වික ණය අයකර ගෙන හෝ ආයතනයට මාරු කරන ලද කල්හි පොත්වලින් කපා හැරේ. හානිකරණ හඳුනා ගත් පසුව සිදු වන සිද්ධියක් හේතුවෙන් පසු වර්ෂයක ඇස්තමේන්තුගත පාඩු ගැලපුම් ප්‍රමාණය අඩු හෝ වැඩි වේ නම් දීමනා ගිණුම ගැලපීම මගින් පෙරදී හඳුනා ගන්නා ලද ගැලපුම් හානි අඩු හෝ වැඩි කෙරේ. අනාගත කපා හැරීමක් පසුව අයකර ගනු ලැබුවහොත් එකී අය කිරීම විස්තීරණ ආදායම ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයට බැර කෙරේ.

වසරකට වඩා පැරණි වෙළෙඳ ලැබීම්/ණයගැතියෝ ගැලපුම් සඳහා ඉදිරිපත් කෙරේ.

2.2.5.2.1 මූලික හඳුනා ගැනීම හා ගණනය කිරීම.

සියලුම මූල්‍ය බැරකම් වෙළෙඳපොළ වටිනාකම මත හඳුනා ගැනේ. මෙයට අදාළ ගනුදෙනු පිරිවැය ඇතුළත් වේ. ආයතනයේ මූල්‍ය බැරකම්වලට වෙළෙඳ හා අනෙකුත් ගෙවීම් ඇතුළත් වේ.

2.2.5.2.2 පසුව කරන ගණනය කිරීම.

මූල්‍ය බැරකම් ගණනය කිරීම ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

(අ) අනෙකුත් මූල්‍ය බැරකම්

ආයතනයේ අනෙකුත් මූල්‍ය බැරකමවලට වෙළෙඳ හා අනෙක් ගෙවීම් ඇතුළත් වේ.

2.2.5.2.3 නැවත හඳුනා ගැනීම

මූල්‍ය වත්කමක් ඉවත් කිරීම සඳහා යළි හඳුනා ගනු ලබන්නේ බැරකම යටතේ වන බැඳීම නිදහස් හෝ අවලංගු හෝ කල් ඉකුත් වූ විට ය. පවත්නා මූල්‍ය බැරකමක් සාරානුකූල වෙනස් කොන්දේසි මත එකම සපයන්නා වෙතින් ලබාගත් මූල්‍ය බැරකමක් මගින්. හිලව් කරනු ලබන කල්හි හෝ පවත්නා බැරකමක් කොන්දේසි අවශ්‍ය පරිදි නවීකරණය කරන ලද කල්හි එවන් හුවමාරුවක් හෝ නවීකරණයක් නියම බැරකමෙහි යළි හඳුනා ගැනීමක් හා නවන බැරකමක හඳුනාගැනීමක් ලෙස සැලකෙන අතර ඉදිරියට ගෙන එනු ලබන අදාළ වටිනාකමෙහි වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

2.2.5.3 මූල්‍ය උපකරණයන්හි හිලව් කිරීම.

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන්නේ මූල්‍ය ශේෂ පත්‍ර දිනට වාර්තා වන ශුද්ධ අගය මත වන අතර අවශ්‍ය වන්නේ නම් හෝ නීත්‍යානුකූල ලෙස අවශ්‍ය වන්නේ නම් ශුද්ධ පදනම මත හඳුනා ගත් වත්කම් හා වගකීම් ඒවායේ උපලබ්බි අගය මත හිලව් කෙරේ.

2.2.6. භාණ්ඩ ලේඛනය

භාණ්ඩ ලේඛනය ලිපි ද්‍රව්‍ය හා නිල මුද්‍රා යන්ත්‍රවලින් සමන්විත වන අතර ඒවායේ වටිනාකම ගණනය කරනුයේ පිරිවැය මත ය.

2.2.7 වෙළෙඳ හා අනෙකුකත් ලැබීම්

මුල් අවස්ථාවේ දී වෙළෙඳ ලැබීම් වෙළෙඳපොළ වටිනාකම මත හඳුනා ගැනෙන අතර පසුව එය ගණනය කරනු ලබන්නේ හානිකරණයන් හා වෙන් කිරීමෙන් පසුඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය මතයි.

හානිකරණයක් සඳහා වෙන් කිරීමෙන් පසු ශුද්ධ අගය තක්සේරු කිරීම මත අනෙකුත් ලැබීම් හඳුනා ගැනේ. වෙන් කරන මුදල් ප්‍රමාණය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

2.2.7.1 බොල් හා අඩමාන ණය වෙන් කිරීම

එක් වසරකට අදාළ ණයගැතියන් හැර අනෙකුත් අය අඩමාන ණය ලෙස සැලකෙන අතර මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර තැබේ.

2.2.8 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන අනෙකුත් දෑ ලෙස අත ඉතිරි මුදල් හා ඉල්ලුම් තැන්පතු ලෙස අර්ථ දක්වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධයෙන් ගත් කල මුදල් හා මුදල් සමාන දෑ, අත ඉතිරි මුදල්, බැංකු තැන්පතු හා ශුද්ධ හිඟ බැංකු අයිරාවන්ගෙන් සමන්විත වේ.

2.3 බැරකම් හා ප්‍රතිපාදන

2.3.1 බැරකම්

මූල්‍ය ශේෂ පත්‍රයේ ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කරන ලද බැරකම් වන්නේ මූල්‍ය ශේෂ පත්‍ර දින සිට වසරක් තුළ කල් පිරෙන බැරකම් ය. ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරණය කෙරෙන අයිතම වන්නේ මූල්‍ය තත්ත්ව දිනයේ සිට වසරකට පසු යම් අවස්ථාවක කල් ඉකුත් වීමට නියමිත අයිතමයන් ය.

2.3.2 ප්‍රතිපාදන, ආපාතික වත්කම් හා ආපාතික බැරකම්

බැරකම් පියවීම සඳහා ආර්ථික වාසි ඇතුළත් සම්පත් විගලනයක් සඳහා ඉඩ ඇති හා බැරකමේ ප්‍රමාණයෙන් විශ්වාසනීය ඇස්තමේන්තුවක් පිළියෙළ කළ හැකි විට දී අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට වර්තමාන බැරකම් පවත්නා අවස්ථාවල දී (නෛතික හා ප්‍රගතිකාරක) ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. බැරකමට විශේෂිත වන්නා වූ අවදානම් හා මුදලේ කාලීන අගය පිළිබඳ වර්තමාන වෙළෙඳපොළ තක්සේරු පිළිබිඹු කරන්නා වූ පෙර බදු අනුපාතිකයක අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම මගින් ප්‍රතිපාදන තීරණය කෙරේ.

2.3.3 වෙළෙඳ හා අනෙකුත් ගෙවීම්

සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියෙහි දී ලබාගන්නා ලද සේවාවන් සඳහා ගෙවීමට ඇති බැඳීම් වෙළෙඳ ගෙවීම් වේ. මේවා වසරක් ඇතුළත හෝ ඊට අඩු කාලයක් තුළ ගෙවීමට නියමිත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර එසේ නොවන්නේ නම් ඒවා ජංගම නොවන බැරකම් ලෙස සැලකේ.

මුල් අවස්ථාවේ දී වෙළෙඳ ගෙවීම් වෙළෙඳපොළ වටිනාකම මත හඳුනා ගැනෙන අතර පසුව එය ඵලදායී පොලී ක්‍රම ය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය මත ගණනය කෙරේ. වට්ටමේ බලපෑම භෞතික නොවන හෙයින් සඳහන් කරන ලද පොලී අනුපාතිකයක් නොමැති කෙටිකාලීන ගෙවීම් මුල් ඉන්වොයිසියේ වටිනාගම මත ගණනය කෙරේ.

2.3.4 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

(අ) නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම්

පාරිතෝෂික සේවකයකු විශ්‍රාම ගැනීමේ දී ලැබෙන විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රමාණය නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම් මගින් නිර්වචනය කෙරේ. බොහෝ විට මෙය වයස, සේවය කල වසර ගණන හා වන්දි වැනි සාධක එකක් හෝ කීපයක් මත පදනම් වේ. 1983 අංක 13 දරන පනත යටතේ ලබාදෙන පාරිතෝෂික මෙම නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුමෙහි දක්වේ.

සේවක ප්‍රතිලාභ පිළිබඳ LKAS 19 හි සඳහන් සූත්‍ර ක්‍රමයට අනුකූල වන සේ විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

වෙන් කරන ලද අරමුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කෙරේ.

(ආ) නිර්වචනය කරන ද දායක සැලසුම් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි අනුව සේවකයන්ට සේවක අර්ථෂාදක අරමුදල් දායකත්වයන් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායකත්වයන් සඳහා හිමිකම් ඇත. ආයතනය සේවකයන්ගේ දළ වේතනවලින් පිළිවෙළින් 12% හා 3% ක දායකත්වයක් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ලබාදෙයි.

2.3.5 ජංගම හා විලම්භිත බදු

(අ) ප්‍රවර්තන බදු

දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් හට ගෙවීමට හෝ ඔහුගෙන් අයකර ගනු ලැබීමට අපේක්ෂිත ප්‍රමාණය මත වර්තමාන හා පූර්ව කාල පරිච්ඡේදයන් සඳහා වර්තමාන ආදායම් බදු වත්කම් හා බැරකම් ගණනය කෙරේ.

ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම් මූලයන් මත පදනම්ව හා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව ගණනය කෙරේ.

(ආ) විලම්භීත බදු

වත්කම් හා බැරකම්හි බදු පදනම් අතර මූල්‍ය තත්ත්වයනට අදාළ දිනයෙහි තාවකාලික වෙනස්වීම් මත බැරකම් ක්‍රමවේදය හා මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා ඉදිරියට ගෙන එනු ලබන ප්‍රමාණයන් භාවිතා කරමින් විලම්භීත බදු ප්‍රතිපාදනය කෙරේ.

සියලු තාවකාලික වෙනස්වීම් සම්බන්ධයෙන් විලම්භීත බදු වත්කම් හා බැරකම් හඳුනා ගැනිණි. අඩු කළ හැකි සියලු තාවකාලික වත්කම් මත විලම්භීත බදු හඳුනා ගන්නා අතර භාවිතා නොකළ බදු බැර හා භාවිතා නොකළ බදු අලාභ තාවකාලික වෙනස්කම් මත අඩු කළ හැකි ඉදිරියට ගෙන යන ලද බදු බැර හා බදු අලාභ භාවිතා කරමින් විලම්භිත බදුකරණය සඳහා යොදා ගැනේ.

ඉදිරියට ගෙන එනු ලබන විලම්භීත බදු වත්කම් සෑම ශේෂ පත්‍ර දිනක ම සමාලෝචනය කෙරේ. විලම්භිත බදු වත්කම්වලින් වර්තමාන බුද අයවන ලාභය අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ. හඳුනා ගනු ලබන බදු ආදායම් නැවත තක්සේරු කරන අතර ශේෂ පත්‍ර දිනට පැවති හඳුනාගනු ලබන ප්‍රමාණයන් අනාගත බදු වන ආදායම් මත විලම්භිත වත්කම් හිලව් කළ හැක.

ශේෂ පත්‍ර දිනට බලාත්මක වී ඇත්තා වූ හෝ ප්‍රමාණවත් ලෙස බලාත්මක වී ඇත්තා වූ බදු අනුපාත හා බදු නීති මත පදනම්ව වත්කම උපලබ්දි වන හෝ වගකීම පියවන වසරට අදාළ කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතික මත විලම්භිත බදු වත්කම් හා වගකීම් ගණනය කෙරේ.

ව්‍යාපාරයේ සෘජුවම ආදායම් බදුවලට අදාළ වන අයිතම තනි ඒකකයක් මත සිදු කෙරේ. ජංගම බදු වත්කම්වලට ජංගම බදු වගකීම් හිලව් කිරීමට නෛතික බලාත්මක හිමිකමක් තිබෙන්නේ නම් සහ එම බදු අය කළ හැකි ඒකක හා බදු අධිකාරිය විලම්භිත බදුවලට අදාළ වන්නේ නම් විලම්භිත බදු වත්කම් හා විලම්භිත බදු වගකීම් හිලව් කෙරේ.

2.3.6 අරමුදල්

රජයේ ප්‍රදානයන්හි නිර්ණායකයන් ඉටු නොනරන්නා වූ ප්‍රදානයන් ඒකක යටතේ වන අරමුදල් සේ හඳුනාගෙන තිබේ.

2.3.7 ප්‍රදානයන් හා සහනාධාර

සහනාධාර හා ප්‍රදානයන් සාපේක්ෂ පිරිවැය සමඟ ගැලපීමට අවශ්‍ය වන කාලය මත ආදායම් ප්‍රකාශයට බැර කෙරෙන අතර ඒවා ක්‍රමානුකූල පදනමක් මත හානි පූර්ණය කිරීමට අපේක්ෂා කෙරේ.

වෙළෙඳපොළ වටිනාකම මත වන අමූල්‍ය ප්‍රදානයන් ඇතුළුව වත්කම්වලට අදාළ ප්‍රදානයන් ශේෂ පත්‍රයෙහි දී විලම්භනය කෙරෙන අතර අදාළ වත්කමේ ප්‍රයෝජ්‍ය ජීව කාලය අනුව ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

ආදායමට අදාළ ප්‍රදානයන් ඒවා ලබා ගත හැකි කාලය තුළ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

2.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2.4.1.1 ආදායම් හඳුනා ගැනීම

(අ) පුහුණු උපදේශන සේවා හා ඵලදායිතාව මගින් ලැබෙන ආදායම

ආර්ථික ප්‍රතිලාභයන් ආයතනයට ගලා එන මට්ටම අනුව ආදායම හඳුනා ගැනේ. ලැබුණු හෝ ලැබීමට නියමිත ප්‍රතිලාභයෙහි වෙළෙඳපොළ වටිනාකම ආදායම ගණනය කෙරේ.

(අ) පොලී ආදායම

පොලී ආදායම ඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් හඳුනා ගැනේ.

(ආ) ලාභාංශ ආදායම

ගෙවීම් හිමිකම් ලැබීමේ ක්‍රමයක් ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගැනේ.

(ඈ) වෙනත්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

(ඉ) ලාභ හා අලාභ

ආයෝජන ඇතුළුව, දේපළ, පිරියත, උපකරණ හා අනෙක් ජංගම නොවන වත්කම් අපහරණය මත ආදායම් ස්වභාවයේ කිසිදු ලාභයක් හෝ අලාභයක් අපහරණ ක්‍රියාවලියෙන් අඩු කර ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර නැත. වත්කම් හා ආශ්‍රිත දේපළවල ඉදිරියට ගෙනා වටිනාකම්, එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි ඉතිරිව පවත්නා පිරියත හා උපකරණ ප්‍රමාණය සමුච්ඡිත ලාභ හා අලාභ වෙත සෘජුවම මාරු කෙරේ.

2.4.2 වියදම් හඳුනා ගැනීම

